# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 44 — 1973 ජනවාරි 26 වැනි සිකුරාද — 1973.01.26

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 131 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 143 |
| තනතුරු–ඇබෑර්තු ... ... ... | 135 | අය–වැය ලේඛන ... ... ... | 146 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 141 | දේපල විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 141 | මාර්ග කොමිටි දැන්වීම ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — | විවිධ දැන්වීම ... ... ... | 150 |


සැළකිය යුතුයි.—(i) ගම්බද අධිකරණ (සංශෝධන) පනත් කෙටුම්පත 1973 ජනවාරි 19 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරණ ලදී. (ii) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 1 දරන නිවාස දේපල උපරිමය පිළිබඳ පනත 1973 ජනවාරි මස 26 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළවේ.

## පළාත් පාලන නිවේදන

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 8 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, මෙම නිවේදනයෙන් වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ බිංගිරියේ ප්‍රාදේශීය ආදායම් නිළධාරි කොට්ඨාශයේ බිංගිරිය ගම් ප්‍රදේශයේ පිහිටි පවත්නා ඡන්ද කොට්ඨාශ නව ඡන්ද කොට්ඨාශවලට බෙදීම සම්බන්ධයෙන් 1972 සැප්තැම්බර් 29 වැනි දින අංක 27 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය එහි වූ උප ලේඛනයේ සඳහන් සියලුම කරුණු වෙනුවට මෙහි උප ලේඛනයේ සඳහන් කරුණු ආදේශ කිරීමෙන් සංශෝධනය කරමි.

ෆි. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍ය.

1972 දෙසැම්බර් මස 18 වෙනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

බිංගිරිය ගම් ප්‍රදේශය

| I වෙනි තීරය<br>දැනට පවත්නා ඡන්ද කොට්ඨාශය | II වෙනි තීරය<br>නව ඡන්ද කොට්ඨාශය |
|---|---|
| අංක 410—මාණලෙම්බුව ... | අංක 3 මාණලෙම්බුව : මාණලෙම්බුව, අගාර, කොරකහ පොකුණ, කොස්ගහගොඩ, එගොඩපිටිය සහ බණ්ඩාරගල්ගොඩ යන ගම් වලින් සමන්විත වේ. |
| | අංක 4 වීරපොකුණ : වීරපොකුණ, දංවිල, හෙණගහපිටිය අළුත්ගම සහ කිණිය මවත්ත යන ගම් වලින් සමන්විත වේ. |
| | අංක 5 කිණියම : ඉහළ කිණියම යන ගමින් සමන්විත වේ. |

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1971 මාර්තු 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

| I වෙනි තීරය<br>දැනට පවත්නා ඡන්ද කොට්ඨාශය | II වෙනි තීරය<br>නව ඡන්ද කොට්ඨාශය |
| --- | --- |
| අංක 412 කිනියම ... | අංක 6 කෝන්කඳවල : ඉහළ කෝන්කඳවල, පහල කෝන්කඳවල, ආඬිගෙදර, පහළ කිණියම, කිරින්දේගම, ඉහළ තලම්පොල, කොල්ලන්දළුව, ගීකියන ගෙදර සහ ආඬිගෙදර වත්ත යන ගම් වලින් සමන්විත වේ. |
| | අංක 7 වෙල්ලන්ගිරිය : වෙල්ලන්ගිරිය, වාද්දදළුපොත, පුවක්ගහකඩවල, පහළ තලම්පොල සහ මකුල්ල පොකුණ යන ගම් වලින් සමන්විත වේ. |
| අංක 413—ගල්වැව<br>අංක 414 බ්‍රාහ්මණයාගම ... | අංක 8 කොස්හේන අගාර : කොස්හේන අගාර, දිය කෙළියාව, කිස්සෝගම, පහළ රඹෙපිටිය සහ ඉහළ රඹෙපිටිය යන ගම් වලින් සමන්විත වේ. |
| | අංක 9 ගැටුලාව : ගැටුලාව මොලඑළිය, බෝගොඩයාගම, මඩිගෙ වෙල්ලන්ගිරිය සහ කන්සදළුව යන ගම් වලින් සහ සිල්හැම්වත්ත, සියඹලාවැව වත්ත, රුවන්එළිය වත්ත යන වතුවලින් සමන්විත වේ. |
| | අංක 10 ගල්වැව : ඉහළ ගල්වැව, පහළ ගල්වැව, ඉහළ මොලඑළිපිටිය, පහළ මොලඑළිපිටිය සහ ගඩොල්වක යන ගම්වලින් සමන්විත වේ. |
| | අංක 11 බ්‍රාහ්මණයාගම : බ්‍රාහ්මණයාගම බෙලිඔත ඔටටු පල්ලම, මෝරාවිල, ඌරාපොත්ත නිට්ටඹුගම, ලබුයාය සහ මරදවිල වත්ත යන ගම්වලින් සමන්විතය. |
| අංක 415—බිංගිරිය ... | අංක 12 මුකලන්හේන : මුකලන්හේන රඹෙගම සහ කරවවැව යන ගම් වලින් සමන්විත වේ. |
| | අංක 13 බිංගිරිය : බිංගිරිය, මුරුකන්ඩිය, තල්ගහපිටිය, විහාරගම සහ ගොඩවෙල යන ගම් වලින් සමන්විත වේ. |
| අංක 416—මාළනාව ... | අංක 14 මාළනාව : මාළනාව, බෝවත්ත දළුපත, හිද්දගම සහ දිවුල්පිටිගම යන ගම්වලින් සමන්විත වේ. |
| | අංක 15 කොස්වත්ත : කොස්වත්ත සහ වදුරුස්ස යන ගම් වලින් සමන්විත වේ. |
| | අංක 16 පානවැව : පානවැව යන ගමින් සමන්විත වේ. |

1–741/1—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍ය ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම මෙම නියෝගයෙන්, කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළේ බටහිර ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ දෙඩන්ගොඩ ගම් ප්‍රදේශයෙහි සීමා වෙනස් කොට නැවත නිරූපනය කිරීමට අදාලව 1972 නොවැම්බර් 9 වැනි දින අංක 32/4 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය එහි වූ “1973” යන ඉලක්කම් වෙනුවට “1974” යන ඉලක්කම් ආදේශ කිරීමෙන් සංශෝධනය කරමි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

1972.12.15 වැනි දින,
කොළඹ දීය.

1–741/2—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලකල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍ය ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම මෙම නිවේදනයෙන්, කළුතර දිස්ත්‍රික්කයේ, පස්දුන් කෝරළේ බටහිර ප්‍රාදේශීය ආදයම් නිලධාරී කොට්ඨාශයේ දෙඩන්ගොඩ සහ නැබොඩ ගම් ප්‍රදේශයන්හි පිහිටි ඡන්ද කොට්ඨාශ අනු කොටස් කර බෙදීමට අදලව 1972 නොවැම්බර් 9 වැනි දින අංක 32/4 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නිවේදනයේ 3 ඡෙදයේ (අ) සහ (ආ) හි “1973” යන ඉලක්කම් වෙනුවට “1974” යන ඉලක්කම් ආදේශ කිරීමෙන් සංශෝධනය කරමි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

1972.12.15 වැනි දින,
කොළඹ දීය.

1–741/3—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5 සහ 10 වැනි වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම මෙම නියෝගයෙන්, කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළේ බටහිර ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ නැබොඩ ගම් ප්‍රදේශය සංස්ථාපනය කිරීමට අදලව 1972 නොවැම්බර් 9 වැනි දින අංක 32/4 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියෝගය එහිවූ දෙවන ඡේදයේ “1973” යන ඉලක්කම් වෙනුවට “1974” යන ඉලක්කම් ආදේශ කිරීමෙන් සංශෝධනය කරමි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

1972.12.15 වැනි දින,
කොළඹ දීය.

1–741/4—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

## ගම්සභා ආඥාපනත

### ආඥාව

(257 වැනි අධිකාරය වන)' ගම්සභා ආඥා පනතේ 47 වැනි වගන්තියේ (2) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බල තල අනුව, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, එකී වගන්තියේ (1) වැනි උප වගන්තිය ; මාතර දිස්ත්‍රික්කයේ කනංකෙ ප්‍රදේශයේ ගම්සභාව සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු ඇමති.

1973 ජනවාරි මස 04 වැනි දින,
කොළඹ දී ය.

1–906—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

ඇල්.ඩී — බී. 22/53

## විදුලිබල පනත

වාරිමාර්ග, විදුලි බලය හා මහා මාර්ග ඇමතිතුමාගෙන් විමසා රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිතුමා විසින් දෙන ලද අනුමැතිය ඇතිව අකුරැස්ස සුළු නගර සභාව විසින් 1957 අංක 59 දරණ පනතින් සංශෝධිත (205 වන අධිකාරය වන) විදුලි බල ආඥාපනතේ 46 වැනි වගන්තිය යටතේ සම්පාදිත වූ නියෝග.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973. 1. 9 වැනි දින,
කොළඹ දීය.

### නියෝග

1. මේ නියෝගවල—

"පනත" යනුවෙන් 1957 අංක 59 දරන පනතින් සංශෝධිත (205 වැනි අධිකාරය වන) විදුලි බල පනත අදහස් කරනු ලැබේ.

"බලපත්‍රය" යනුවෙන් පනතේ 2 වැනි වගන්තිය යටතේ අකුරැස්ස සුළු නගර සභාව වෙත නිකුත් කරන ලද බලපත්‍රය අදහස් කරනු ලැබේ.

"බලපත්‍රලාභියා" යනුවෙන් අකුරැස්ස සුළු නගර සභාව අදහස් කරනු ලැබේ.

2. තම ප්‍රයෝජනය පිණිස බලපත්‍රලාභියාගෙන් විදුලි බලය ලබා ගැනීමට බලාපොරොත්තු වන යම් කෙනෙකු විසින්—

(අ) විදුලි බලය ලබා ගැනීමට ඕනෑ කරන දින සිට යටත් පිරිසෙයින් දවස් දහහතරකට මත්තෙන් ඒ සඳහා බලපත්‍රලාභියා විසින් සපයනු ලබන ආකෘති පත්‍රයෙහි පිළියෙල කළ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය. තවද,

(ආ) විද්‍යුත් වේගවාහක කේබල් කම්බිය සඳහා ගාස්තු බලධාරියා වෙත කලින් ගෙවීම හෝ බලපත්‍රලාභියා එසේ නියම කරන්නේ නම් ආඥාපනතේ 33 වැනි වගන්තිය යටතේ බලපත්‍රලාභියා සමග ලිඛිත ගිවිසුමකට ඇතුලත්වීම කළ යුතුය.

3. (අ) බලපත්‍රලාභියාගේ විද්‍යුත් වේගවාහක ප්‍රධාන කම්බියට සම්බන්ධ කිරීමට අදහස් කරන විදුලිබල සංස්ථාපනයක කම්බි ඇදීම පාරිභෝගිකයා විසින් කම්බි ඇදීම පිළිබඳව ඉන්ජිනේරු ආයතනය විසින් නියම කරනු ලැබූ නියෝග වලට අනුව කටයුතු කළ හැකි සමාගමකට හෝ පුද්ගලයෙකුට පැවරිය යුතුය. බලපත්‍රලාභියා විසින් බලය පවරනු ලැබූ නිලධාරියකු විසින් ඒ කර්මාන්තය පරීක්ෂාකොට අත්හදා බැලීමෙන් හා කම්බි ඇදීම පිළිබඳ ඉහතකී නියෝග අනුව ඒ කර්මාන්තය නියමකර ඇත්තේ යයි බලපත්‍රලාභියා සෑහීමකට පත්වූවාට පසු පමණක් එබඳු ස්ථානයකට විදුලිය බලය සැපයිය හැකිය.

(ආ) සංස්ථාපනය එකී නියෝගවලට අනුකූල නොවන්නේ නම්, ඒ සංස්ථාපනය ඒ නියෝගවලට අනුකූලව සකස් කරනු ලබන තුරු ඒ ස්ථානයට විදුලි බලය නොදිය යුතුය.

4. විදුලි බලය පාවිච්චි කරන සෑම පාරිභෝගිකයෙකු විසින්ම බලපත්‍රයේ සඳහන් කරන ලද ප්‍රමාණ අනුව ඒ විදුලි බලය සඳහා මුදල් ගෙවිය යුතුය.

5. (අ) පාරිභෝගිකයාට අයත් භූමියෙහි පිහිටුවා තිබෙන විද්‍යුත් වේගවාහක කම්බියේ කොටස, විදුලි බල පරිවර්තක, ප්‍රධාන ගිනිනූල් විද්‍යුත් මාපක සහ විදුලි යතුරු පුවරුද බලපත්‍රධාරියා සතු දේපළ වශයෙන් පැවැති යුතු අතර, බලපත්‍රලාභියාගේ බලය පවරනු ලැබූ සේවකයෙකු විසින් හැර වෙන යම් කෙනෙකු විසින් මොනම කරුණක් සඳහාවත් ඒවා වෙනස් කිරීම හෝ අතපත ගෑම හෝ නොකළ යුතුය.

(ආ) බලපත්‍රලාභියාගේ ප්‍රධාන ගිනි නූලේ හෝ මීටරයේ සිට ස්වකීය පාර්ශ්වයේ ඇත්තාවූ කම්බි, කේබල් කම්බි හා උපකරණ නඩත්තු කිරීම ගැන පාරිභෝගිකයා විසින් වගකිය යුතුය.

(ඇ) ආඥාපනතේ 47 (3) වැනි වගන්තිය යටතේ අසම්බන්ධ කරන ලද විදුලි බල සංස්ථාපනයක් නැවත සම්බන්ධ කිරීමේදී එය සෝදිසිකර බැලීම හා නැවත සම්බන්ධ කිරීම සඳහා බලපත්‍රයෙහි විධිවිධාන සලසා ඇති පරිදි උචිත ගාස්තුවක් අය කළ යුතු අතර, පාරිභෝගිකයා විසින් කලින් ගෙවිය යුතුය.

(ඈ) යම් පාරිභෝගිකයෙකුගේ විදුලි කම්බිවල හෝ උපකරණවල යම් කොටසකින් විදුලි බලය කාන්දුවීමක් සිදුවුවහොත් ස්වකීය ස්ථානයේ පාවිච්චිවූ ලෙස මාපකයේ සටහන් වූ සියලුම විදුලි බලය සඳහා පාරිභෝගිකයා විසින් විදුලි බල ආඥාපනතේ 41 වන වගන්තියට අනුව මුදල් ගෙවීමට බැඳී සිටිය යුතුය.

6. (අ) තමාට විදුලි බලය සැපයූවාට පසු යම් විටෙක තාවකාලිකව හෝ ස්ථිර වශයෙන් යම් ලාම්පුවක් හෝ පංකාවක් හෝ දැනට පාවිච්චි කරන මෝටරයට වඩා විශාල වූ මෝටරයක් පාවිච්චි කිරීමට හෝ වැඩිපුර යම් ලාම්පුවක් හෝ විදුලි බලය පාවිච්චි වන වෙනයම් උපකරණයක් සවිකිරීමට හෝ තමාගේ දේපොලෙහි ඇද තිබෙන විදුලි කම්බි කොයි අන්දමකින් නමුත් වෙනස් කිරීමට හෝ දික් කිරීමට හෝ අදහස් කරන සෑම පාරිභෝගිකයෙකු විසින්ම, එබඳු දික් කිරිමක් හෝ වෙනස් කිරීමක් පිළිබඳව කටයුතු ආරම්භ කිරීමට යටත් පිරිසෙයින් දින දෙකකටවත් මත්තෙන් එබඳු යම් වෙනස් කිරීමක් හෝ දික් කිරීමක් පිළිබඳව බලපත්‍රලාභියා වෙත දැනුම් දිය යුතුය.

(ආ) කිසිම පාරිභෝගිකයෙකු විසින් තාවකාලිකව හෝ ස්ථිර වශයෙන්, යම් දීර්ඝ කිරීමක්, ලාම්පුවක් හෝ පංකාවක් හෝ දැනට පාවිච්චිකරන මෝටරයකට වඩා විශාල වූ මෝටරයක් පාවිච්චි කිරීම හෝ වැඩිපුර යම්කිසි ලාම්පුවක් හෝ විදුලි බලයෙන් ක්‍රියාකරන උපකරණයක් විද්‍යුත් වේග වාහක ප්‍රධාන කම්බියට සවි කිරීම, ඒ දීර්ඝ කිරීම, ලාම්පුව, පංකාව, මෝටරය, වැඩිපුර ලාම්පු හෝ වෙනත් උපකරණ බලපත්‍රධාරියා විසින් ඒ සඳහා බලය පවරන ලද නිලධාරියකු විසින් පරීක්ෂාකොට අත්හද බලා සතුටුදායකයයි ඒත්තු ගතහොත් මිස, සවි නොකළ යුතුය.

7. (අ) යම් ස්ථානයක බලපත්‍රලාභියාගේ ගිනිනූල උණුවී ගිය හොත්, පාරිභෝගිකයා විසින්, අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රලාභියාගේ විදුලි බලස්ථානය හෝ උප බලස්ථානය භාර නිලධාරියා වෙත ඒ බව වහාම දැනුම් දිය යුතුය.

(ආ) බලධාරියා විසින් බලය දෙනලද නිලධාරියෙකුගෙන් හෝ බලපත්‍රලාභියා විසින් සේවයෙහි යොදවා සිටින කම්කරුවෙකු නොවන කිසිම තැනැත්තකු විසින් බලපත්‍රලාභියාගේ දේපළ වන උණුවී ගිය ගිනි නූල වෙනුවට වෙනත් ගිනි නූලක් දැමීම නොකළ යුතුය.

(ඉ) පාරිභෝගිකයාගේ හෝ බලපත්‍රලාභියාගේ හෝ දේපළ වන යම් ගිනි නූලක් වෙනුවට වෙනකක් දැමීමට බලපත්‍රලාභියාගේ යම් නිලධාරියෙකු හෝ කම්කරුවෙකුගේ හෝ සේවය වුවමනා කරන්නේ නම්, ඒ සඳහා ගෙවිය යුතු බලපත්‍රයේ සඳහන් උචිත ගාස්තුව පාරිභෝගිකයාගේ ඒ මාසයේ ගණනට ඇතුළත් කළ යුතුය.

8. විදුලි බලය සැපයීමේදී සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ සිදුවන බාධා හේතුකොටගෙන නියම වශයෙන් හෝ අනියම් වශයෙන් හෝ සිදුවන පාඩුවක් හෝ අලාභ හානියක් සම්බන්ධයෙන් බලපත්‍රලාභියා පාරිභෝගිකයාට වගකීමට බැඳී නොසිටී.

9. ආඥාපනතේ 45 වැනි වගන්තිය යටතේ අසම්බන්ධකොට තිබුණා වූ විදුලි බල සංස්ථාපනයක් නැවත සම්බන්ධ කරන කල්හි එය අත්හදා බැලීම හා නැවත සම්බන්ධ කිරීම සඳහා බලපත්‍රයේ සඳහන් ගාස්තුවක් අයකළ යුතුවාක් හැර, එය පාරිභෝගිකයා විසින් කලින් ගෙවිය යුතුය.

10. (අ) සියලුම අය කිරීම්, ගණනක් ඉදිරිපත් කරනු ලැබූ දිනයට අයවිය යුතුව තිබෙන්නාසේ සැළකිය යුතුය.

(ආ) යම් ගණනක් වෙත ඉදිරිපත්කොට සතියක් ඇතුළතදී කරන ලද්දේ නම් මිස ගණනක හරි වැරදි පිළිබඳ වූ කිසිම පැමිණිල්ලක් බලපත්‍රලාභියා විසින් භාර නොගත යුතුය.

11. (අ) ස්වකීය ස්ථානයට විදුලි බලය අනවශ්‍ය සෑම පාරිභෝගිකයෙකු විසින්ම ඒ බව තුන් දවසකට කලින් බලපත්‍රලාභියා වෙත ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි,

(ආ) (අ) ඡේදයේ සඳහන් දැනුම්දීම කර නොමැති කල්හි, විදුලි බලය අනවශ්‍ය බව දන්වමින් බලපත්‍රලාභියා දැන්වීම ලබන දින සිට දවස් තුනක් ගතවන තුරු ඒ ස්ථානයේ බලපත්‍රලාභියාගේ උප කරණ සම්බන්ධයෙන් පාරිභෝගිකයා වග කිය යුතු අතර, ඒ ස්ථානයේ පාවිච්චි කරන්නට යෙදුනා සියලුම විදුලි බලය සම්බන්ධයෙන් ගාස්තු ගෙවීමටද පාරිභෝගිකයා යටත් විය යුතුය. එසේ වුවද එකී දවස් තුන අවසාන වන්නට මත්තෙන් බලපත්‍රලාභියා විසින් සේවය අසම්බන්ධ කරන ලද්දේ නම්, සේවය අසම්බන්ධ කරනු ලබන තාක් ඒ ස්ථානයේ පාවිච්චිවන විදුලි බලය සම්බන්ධයෙන් පමණක් ගාස්තු ගෙවීමට පාරිභෝගිකයා යටත් විය යුතුය.

12. යෝජිත කර්මාන්තය බලපත්‍රලාභියාගේ නිලධාරියෙකු විසින් පරීක්ෂාකර බැලීමට හැකි වන පරිදි ඒ පිළිබඳ දවස් දෙකකට නොඅඩු දින ගණනකට කලින් දැනුම් දීමෙන් පසුව මිස, දැනට පවත්නා විදුලි බල සංස්ථාපනයක එක් කිරීම්, වෙනස් කිරීම් හෝ සකස් කිරීම් ඇතුළුව විදුලි බල සංස්ථාපන කර්මාන්ත වැනි කිසිදු විදුලි කර්මාන්තයක් ආරම්භ නොකළ යුතුය.

13. බලපත්‍රලාභියා වෙත දැන්වීමක් නොකරනු ලැබ හා ඔහුගේ අනුමැතිය කලින් ලබා නොගෙන යම් ස්ථානයක අළුත් විදුලි බල සංස්ථාපනයක් සම්බන්ධයෙන් වූ යම් විදුලි කර්මාන්තයක් කර ගෙන යන්නේ නම්, බලපත්‍රලාභියා වෙත විධිමත් දැනුම්දීමක් ලැබෙන තුරු හා අවශ්‍ය අත්හදා බැලීම් කරන තුරු බලපත්‍රලාභියා විසින් එකී විදුලි කර්මාන්තය කරගෙන යන ලද ස්ථානයට විදුලි බලය සැපයීම ප්‍රතික්ෂේප කරත හැකිය.

14. බලපත්‍රලාභියාට කලින් දැන්වීමක් නොකර හා ඔහුගේ අවසරය ලබා නොගෙන බලපත්‍රලාභියාගේ විද්‍යුත් වේගවාහක ප්‍රධාන කම්බියට සවිකර ඇත්තාවූ විදුලි බල සංස්ථාපනයක යම් දීර්ඝ කිරීමක් කරගෙන යනු ලබන විට සම්පූර්ණ විදුලි බල සංස්ථාපනයම සවිකිරීම බලපත්‍රලාභියාගේ විද්‍යුත් වේගවාහක ප්‍රධාන කම්බියෙන් අසම්බන්ධ කරනු ලැබීමට යටත්විය යුතුය.

15. යම් විදුලි බල සංස්ථාපනයක් නැවත සම්බන්ධ කිරීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම බලපත්‍රලාභියා විසින් ඒ සඳහා සපයනු ලැබිය හැකි ආකෘති පත්‍රයක ඉදිරිපත් කළයුතු අතර, විදුලි බලය අවශ්‍ය වන්නට පැය හතලිස් අටකට නොඅඩු කාලයකට ප්‍රථම එය බලපත්‍රලාභියාගේ කාර්යාලය වෙත භාරදිය යුතුය.

01–877—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

ඇල්. ජී. — බී 89/52.

**නානායම් පනත**

(275 වැනි අධිකාරය වන) නානායම් පනතේ 4 වැනි වගන්තිය යටතේ පේරාදෙනිය නානායම සම්බන්ධයෙන්, ඒ සඳහා නියමිත බලධාරියා වන, මහනුවර නාගරිකයේ විශේෂ කොමසාරිස් විසින් සාදනු ලැබ එම වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද රීතිය.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ
අතිරේක ලේකම්.

1973 ජනවාරි මස 6 වැනි දින,
කොළඹ දී ය.

රීතිය

1958 ජනවාරි මස 10 වැනි දින අංක 11,236 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ කලින් කල සංශෝධනය කරනු ලැබූ, පේරාදෙනිය නානායම සම්බන්ධ රීතිවල 17 වැනි රීතිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙසින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) එහි (2) වැනි ඡේදයේ "10" යන ඉලක්කම වෙනුවට "30" යන ඉලක්කම ආදේශ කිරීමෙන්, හා

(ආ) එහි (3) වැනි රීතියේ "10" යන ඉලක්කම වෙනුවට "30" යන ඉලක්කම ආදේශ කිරීමෙනි.

01–744—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

**කොච්චිකඩේ සුළු නගර සභාව**

**සුළු නගර සභා ආඥාපනත**

**1973 වර්ෂය සඳහා වූ විශේෂ කසළ ශෝධන බද්ද**

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) වැනි වගන්තිය යටතේ කොච්චිකඩේ සුළු නගර සභාව විසින්, අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් හා නිදහස් කිරීම්වලට යටත්ව කොච්චිකඩේ නගරය තුළ පිහිටා ඇති සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හතර බැගින් වූ විශේෂ කසළ ශෝධන බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි දී සමාන කොටස් හතරකින් ගෙවිය හැකි වන සේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන කොමසාරිස් විසින් දෙන ලද අනුමතිය ඇතිව 1973 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. ජී. වී. එස්. ද අල්විස්,
පළාත් පාලන කොමසාරිස්.

1973 ජනවාරි 8 වැනි දින,
කොළඹ දී ය.

01–978—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

එල්. ජී.—බී. 9/66.

**කින්නියා නගරය**

**සුළු නගර සභා ආඥාපනත**

**1973 වර්ෂය සඳහා වූ දේපළ බද්ද**

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 183 (5) (අ) වන වගන්තිය සමග කියවියයුතු ඒ ආඥාපනතේ 159 (1) වන වගන්තිය යටතේ සහ ඒ වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් දෙන ලද අනුමැතිය ඇතිව කින්නියා නගරයේ විශේෂ කොමසාරිස් විසින් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්, සුදුසුකම් සහ කොන්දේසිවලට යටත්ව කින්නියා නගරය තුළ පිහිටි සියලුම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට හතරක වරිපනම් බද්දක් පිළිවෙළින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හිදී හෝ ඉන් පෙර සමාන කොටස් හතරකින් ගෙවිය හැකි වනසේ කින්නියා නගරයේ විශේෂ කොමසාරිස් විසින් 1973 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1972 දෙසැම්බර් මස 29 වන දින,
කොළඹ දීය.

01–673—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

**කැකිරාව සුළු නගර සභාව**

**සුළු නගර සභා ආඥාපනත**

**1973 වර්ෂය සඳහා වූ විශේෂ ජල බද්ද**

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) වැනි වගන්තිය යටතේ කැකිරාව සුළු නගර සභාවේ පාලන නිලධාරි විසින්, අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි සීමාකිරීම් හා නිදහස් කිරීම්වලට යටත්ව කැකිරාව නගරය තුළ පිහිටා ඇති සියලුම නිශ්චල දේපලවල (කුඹුරු හා මුඩුබිම් හැර) වාර්ෂික වටිනාකමින් සියයට පහ බැගින් වූ විශේෂ ජල බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි දී සමාන කොටස් හතරකින් ගෙවිය හැකි වන සේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන කොමසාරිස් විසින් දෙන ලද අනුමතිය ඇතිව 1973 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. ජී. වී. එස්. ද අල්විස්,
පළාත් පාලන කොමසාරිස්.

1973 ජනවාරි 9 වැනි දින,
කොළඹ දීය.

01–981—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

ගම්සභා ආඥපනත

13 වැනි වගන්තිය යටතේ දැන්වීම

1961 අංක 60 දරණ සංශෝධිත ගම්සභා ආඥපනතේ (257 වැනි අධිකාරය) 13 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරූ බලතල ප්‍රකාර බදුල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් තම්බි සාහිබු අයිදුරුස් කමාල්දීන් වන මම කුඹල්වෙල ගම්සභාවේ අංක 6 දරණ කොට්ඨාශයේ නියෝජිත දෙලමුල්ල කාන්කානම්ගේ පියසේන මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභා රැස්වීම් වාර තුනකට වඩා වැඩි ගණනක් තමන් තෝරා පත්කර ගැනීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමකට පත්ව බදුල්ල දිස්ත්‍රික්කයේ කුඹල්වෙල ගම්සභාවේ අංක 6 දරණ කොට්ඨාශයේ සභික දෙලමුල්ල කාන්කානම්ගේ පියසේන මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ කිරීමේ දින සිට තම සභිකත්වය අත් හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

ටී. අයි. කමාල්දීන්,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
බදුල්ල.

1973 ජනවාරි මස 13 දින,
පළාත් පාලන කාර්යාලය,
බදුල්ල.

01–967—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

නුවරඑළිය දිස්ත්‍රික්කයේ කඳපොල ගම්සභාවේ ඡන්ද කොට්ඨාශ නැවත බෙදීම සම්බන්ධව පරීක්ෂා කිරීමේ නිල කමිටුව

1. (අ) සභිකයකු නියෝජනය කරන එක් එක් ඡන්ද කොට්ඨාශයේ සංඛ්‍යාව හැකිතාක් දුරට සමාන වනසේ, ප්‍රදේශයේ විශාලත්වය, ජනගහනය හා වෙනත් හේතු සාධක සලකා බලා ඉහත ගම්සභාවේ ඡන්ද කොට්ඨාශ නැවත බෙදීම; සහ

(ආ) ගම්සභාවේ එක් එක් ඡන්ද කොට්ඨාශයේ සීමාවල විස්තර, සම්බන්ධ කරුණු ගැන පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා, පහත සඳහන් නියෝජිතයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත්කර තිබේ :—

(1) නුවරඑළිය පළාත් පාලන සහකාර කොමසාරිස්, ඇල්. පී. සිරිවර්ධන මහතා (සභාපති)

(2) නුවරඑළිය ප්‍රාදේශීය ආදායම් නිලධාරි, අභය කපුආරච්චි, මහතා

(3) නුවරඑළිය සහකාර මැනුම් අධිකාරී, ඒ. එල්. එස්. කොබෙවත්ත මහතා.

2. මෙම කරුණ සම්බන්ධයෙන් සැළකිල්ලක් දක්වන මහජනයා හෝ ආයතන හෝ ඇතොත් ඔවුන් තම අදහස් පිටපත් තුනකින් යුත් ලියකියවිලි මඟින් පහත සඳහන් ලිපිනයට 1973 ජනවාරි 31 වැනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි එවන මෙන් දන්වා සිටිමි.

එල්. පී. සිරිවර්ධන,
පරීක්ෂණ කමිටුවේ සභාපති සහ නුවරඑළිය කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්.

1973 ජනවාරි මස 2 වැනි දින,
නුවරඑළිය,
පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේදීය.

01–526—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

ගම්සභා ආඥපනත

13 වන වගන්තිය යටතේ දැන්වීමයි

1961 වර්ෂයේ අංක 60 දරණ ගම්සභා (සංශෝධිත) පනතින් සංශෝධිත ගම්සභා ආඥපනතෙහි (257 වැනි අධිකාරය) 13 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරි ඇති බලතල ප්‍රකාර, කොළඹ දිසාවේ පළාත් පාලන සහකාර කොමසාරිස්, කෝන්ආර මුදියන්සේලාගේ අබේසිංහ වන මම, කොළඹ දිස්ත්‍රික්කයේ තලාහේන ගම්සභාවේ අංක 5 දරණ කොට්ඨාශයේ සභික ඩී. ජෝශප් මයිකල් ප්‍රනාන්දු මහතා, සභාවට දැන්වීමක් නොමැතිව, සභාවේ රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට තමන් පත්කර ගැනීමෙන් පසුව නොපැමිණි බවට සෑහීමකට පත්ව, කොළඹ දිසාවේ තලාහේන ගම්සභාවේ අංක 5 දරණ කොට්ඨාශයේ සභික ඩී. ජෝසප් මයිකල් ප්‍රනාන්දු මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළකිරීමේ දින සිට සභිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

කේ. ඇම්. අබේසිංහ,
කොළඹ දිසාවේ පළාත් පාලන සහකාර කොමසාරිස්.

1973 ජනවාරි මස 10 වැනි දින,
පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,
බම්බලපිටිය.

01–941—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

# තනතුරු—ඇබෑර්තු

## ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි

1. දීමනා.—රජයේ නිලධාරීන්ට අදාළ වන ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක දීමනාවක් ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම වූ කලී 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනතට හා පළාත් පාලන සේවා රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අතිකුත් සේවා කොන්දේසි වලටත් යටත් වෙයි.

3. සේවය භාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(අ) පළාත් පාලන සේවයේ මාසික වැටුප් ගෙවනු ලබන තනතුරුවලට පත්කරනු ලබන සියලු දෙනාම, පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදලට දායක වනු ඇත. මෙම අරමුදලට සේවකයා විසින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් සියයට 6ක් දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය. අදාළ නිළධාරීතැනගේ ඒකාබද්ධ වැටුපෙන් සියයට 9ක් ඔහු සේවය කරනු ලබන ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඔහු වෙනුවෙන් ගෙවනු ලැබේ.

(ආ) ආණ්ඩුව යටතේ සේවය කරන නිළධාරීන්, ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වන වගන්තිය යටතේ සේවයෙන් මුද හරිනු ලැබ, පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරුකරනු ලැබුවහොත්, ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ. පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිළධාරියෙකු එම සේවයේ විශ්‍රාම වැටුප් සහිත වෙනත් තනතුරකට පත්කරන ලද්දේ නම් හෝ උසස් කරන ලද්දේ නම් ඔහු සිය නව තනතුරෙහිද විශ්‍රාම වැටුප් හිමිකම් තවදුරටත් භුක්ති විඳිනු ඇත.

(ඇ) ප්‍රාදේශීය බලමණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථාවේ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ, 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනත ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට කලින්ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බලමණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඈ) පළාත් පාලන සේවයේ මාසික වැටුප් ගෙවනු ලබන තනතුරු වලට පත්කරනු ලබන නිළධාරීන්ට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය අදාළ නොවනු ඇත. එහෙත්, ස්ත්‍රීන්ද, වයස අවුරුදු 55ට වැඩි නිළධාරීන්ද, පළාත් පාලන සේවයට පත්කරන ලද දිනයට පෙර, ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිළධාරීන්ද හැර, පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක සිට වෙනත් විශ්‍රාම වැටුප් සහිත තනතුරකට උසස් කරන හෝ පත්කරන ලද සියලු දෙනාටම 1952 ජුනි 30 වන දින හා 10,329 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය අනුමාන මූලික වැටුපෙන් සියයට 4ක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඒ ඒ නිළධාරීයාගේ අනුමාන මූලික වැටුපෙන් සියයට 3ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඉ) ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක්, මුලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආපකාර සමාගමක් මඟින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මඟින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත්වන්නාට නියම කළ හැකිය.

(ඊ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුවද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(උ) අන්‍යාකාරයකින් නියමකොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(ඌ) අයදුම්කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නුපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) පිරවිය යුතුය.)

6. විවාහකද? අවිවාහකද? වැන්දඹුද? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—.

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපනික සුදුසුකම් :

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍රය/අ.පො.ස. (සාමාන්‍ය පෙළ)

| | සමත්වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ය සාමාර්ථය |
|---|---|---|---|---|
| පළවෙනි වාරය | | | | |
| දෙවැනි වාරය | | | | |

(ආ) අ.පො.ස. (උසස් පෙළ)

| සමත්වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ය සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

(ඇ) වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම්—

| විභාගයේ නම | සමත්වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(ඈ) සමර්ථ වී ඇති උසස්ම විභාගය :—

(i) සිංහල :————.

(ii) දෙමළ :————.

(iii) ඉංග්‍රිසි :————.

9. ලබාගෙන ඇති වෘත්තිය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතන වල නම් :————.

10. වෘත්තිය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :—

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය දූරු තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දූරු තනතුරු සඳහන් කරන්න :————.

(ආ) මීට පළමු, ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාල සීමාවන් :————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලටන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—ශීස්නාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කථා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන්කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද, එසේ නම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක්ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,
තැ. පෙ. 530, කොළඹ 1.

**I ශ්‍රේණියේ ප්‍රධාන විදුලි මාර්ග යාන්ත්‍රික තනතුර**

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

2. **වැටුප.**—තනතුරට නියමිත වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 3,090—90×16—රු. 4,530 යනුවෙනි. එහි වර්ෂයකට රු. 3,990 ක වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක් වේ.

3. **අවශ්‍යසුදුසුකම්.**—

(අ) 1973 මාර්තු 1 වැනි දිනට වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවන් 7 වන පංතියෙන් සමත් වී තිබිය යුතුය.

(ඇ) අයදුම්කරුවන් පහත සඳහන් කාර්යයන් පිළිබඳව ලංකා විදුලිබල මණ්ඩලය යටතේ අභ්‍යාස පාඨමාලාවක් හෝ වෘත්තීය ආධුනිකත්වයක් සම්පූර්ණ කර තිබිය යුතුය :—

(i) කිලෝවොට්ස් 11 දක්වා ස්විච් ගියර් සහ ට්‍රාන්ස්ෆෝමර් (පරිවර්තක) නඩත්තු කිරීම,

(ii) ට්‍රාන්ස්ෆෝමර් තෙල් පවිත්‍ර කිරීම,

(iii) කේබල් පිරිද්දීම—කිලෝවොට්ස් 11,

(iv) කිලෝවොට්ස් 11 ස්විච් ගියර් හා ට්‍රාන්ස්ෆෝමර් සවි කිරීම හා ක්‍රියා කරවීම,

(v) කිලෝවොට්ස් 11 සහ අවශක්මතා (එල්.ටී.) භූගත කේබල් කම්බි ඇඹීම හා පරීක්ෂා කිරීම,

(vi) මෝටර් සහ විදුලි ට්‍රාන්ස්ෆෝමර් සවිකිරීම,

(vii) නඩත්තු වාර්තා තබා ගැනීම, විදුලි අතිශක්මතා ක්‍රමය ආදිය,

(viii) අධික පීඩනය පරීක්ෂා කිරීම ආදිය.

නැතහොත්

(ඈ) අයදුම්කරුවන් පහත දැක්වෙන කාර්යයන් පිළිබඳ පළපුරුද්දක් ඇත්තාවූ සහ ප්‍රාදේශීය බලමණ්ඩලවල අවුරුදු 10 ක සේවය සම්පූර්ණ කර ඇති කම්බිකරුවන් හෝ II ශ්‍රේණියේ විදුලි මාර්ග යාන්ත්‍රිකයන් විය යුතුය :—

(i) කිලෝවොට්ස් 11 දක්වා ස්විච් ගියර් හා ට්‍රාන්ස්ෆෝමර් නඩත්තු කිරීම,

(ii) ට්‍රාන්ස්ෆෝමර් තෙල් පවිත්‍ර කිරීම,

(iii) කේබල් පිරිද්දීම—කිලෝවොට්ස් 11,

(iv) කිලෝවොට්ස් 11 ස්විච් ගියර් සවිකිරීම හා ක්‍රියා කරවීම,

(v) කිලෝවොට්ස් 11 සහ අවශක්මතා (එල්.ටී.) භූගත කේබල් ඇඹීම හා පරීක්ෂා කිරීම,

(vi) මෝටර් සහ විදුලි ට්‍රාන්ස්ෆෝමර් සවිකිරීම,

(vii) නඩත්තු වාර්තා තබා ගැනීම, විදුලි අතිශක්මතා ක්‍රමය ආදිය;

(viii) අධික පීඩනය පරීක්ෂා කිරීම ආදිය.

(උප්පැන්න සහතිකයේ පිටපතක් ද, යථෝක්ත (ඇ) සහ (ඈ) යටතේ සඳහන් සුදුසුකම් සනාථ කිරීම සඳහා පිටපතක් ද අමුණා එවිය යුතුයි.)

4. මේ ගැසට් පත්‍රයේ IV වෙනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. **ඉල්ලුම් පත්‍ර.**—පත්කිරීම සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට 1973.03.01 දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

උප්පැන්න සහතිකයේ හා අනෙක් සහතිකවල පිටපත් (මුල් සහතික නොව) අයදුම්පතට අමුණා එවිය යුතුයි. මේ ලියවිලිවල පිටපත් නොමැතිව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

6. අයදුම්පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නොවේ.

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලන ආයතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණ බවට සහතික කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. තෝරාගනු ලබන අපේක්ෂකයින් තමන් පත්කරන පළාත් පාලන ආයතනයේ සීමාව තුළ පදිංචිවීමට අවශ්‍ය විය හැකිය.

9. අවශ්‍ය සුදුසුකම් ඇති ඉල්ලුම් පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1973 ජනවාරි මස 10 වැනි දින,
කොළඹ, තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

1–853—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

**පළාත් පාලන සේවය**

තාක්සේරු පරීක්ෂක තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත්‍ර කැඳවයි.

2. **වැටුප.**—තනතුරට නියමිත වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 4,152—144×17 සහ 180×8—රු. 8,040 වේ. මේ වැටුප් ක්‍රමයෙහි රු. 6,024 යන වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයක් ද, රු. 7,500 යන වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක් ද ඇත. මෙයට අමතරව, රජයේ නිලධාරීන්ට අදාළ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක දීමනාවක් ද, විවාහක නිලධාරීන්ට ගෙවනු ලැබේ.

3. තෝරා ගන්නා ලද අයදුම්කරුවන් රු. 6,024 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉම් ඉක්මවීමට පළමු ලංකා කාර්මික විද්‍යාලයේ තාක්සේරු ඩිප්ලෝමාවේ පළමු වැනි වෘත්තීය පරීක්ෂණයෙන් සමත්වීමට නියම කෙරේ.

3. **අවශ්‍ය සුදුසුකම්.**—

(අ) 1973.02.26 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 30 ට නොවැඩි විය යුතුයි.

(ආ) (i) අයදුම්කරුවන් ලංකා කාර්මික විද්‍යාලයේ තාක්සේරු ඩිප්ලෝමා පාඨමාලාවේ දෙවැනි වර්ෂයේ ශාස්ත්‍රීය පරීක්ෂණය සාර්ථක ලෙස සම්පූර්ණ කොට සිටිය යුතුය. නැතහොත්,

(ii) ලංකා කාර්මික විද්‍යාලයේ නැතහොත් ගොඩනැගිලි කරුවන්ගේ ප්‍රමාණ සහ ගිණුම් හා මට්ටම් කිරීම පිළිබඳ දැවුරුදු සන්ධ්‍යා කාල පාඨමාලාවක් සමග ගොඩනැගිලි නිර්මාණය පිළිබඳ තුන් අවුරුදු සන්ධ්‍යා පෙළ පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණකර ඉහත සඳහන් සුදුසුකම් ලබා ගැනීමෙන් අනතුරුව අගය ප්‍රමාණ කිරීම පිළිබඳ දැවුරුද්දක ප්‍රායෝගික පළපුරුද්ද ලබා සිටිය යුතු ය.

(ඇ) ("i") හි සඳහන් සුදුසුකම් ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

4. අගය ප්‍රමාණ කිරීම පිළිබඳ අවශ්‍ය ප්‍රායෝගික පළපුරුද්ද ඇති අයදුම්කරුවන් නැති වුවහොත්, ප්‍රායෝගික පළපුරුද්ද නැති නමුදු ඉහත 3 (ආ) ii හි සඳහන් කාර්මික සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් ද සලකා බලනු ලැබේ. එවැනි අයදුම්කරුවකු පත්කරනු ලැබුවහොත්, පහත සඳහන් වැටුප් පියවරවල් මත තබනු ලැබේ :—

අවුරුදු එකක ප්‍රායෝගික පළපුරුද්ද ඇති අය :—1 වෙනි වර්ෂය රු. 4,008 ; 2 වෙනි වර්ෂය—රු. 4,152.

කිසිදු ප්‍රායෝගික පළපුරුද්දක් නැති අය :—1 වෙනි වර්ෂය :—රු. 3,864 ; 2 වෙනි වර්ෂය— රු. 4,008 ; 3 වෙනි වර්ෂය—රු. 4,152.

එසේම ලංකා කාර්මික විද්‍යාලයේ තාක්සේරු ඩිප්ලෝමා පාඨමාලාවේ දෙවෙනි වර්ෂයේ ශාස්ත්‍රීය පරීක්ෂණයට පෙනී සිටි අයදුම්කරුවන්ට, ප්‍රතිඵල නිකුත්වීම බලාපොරොත්තුවෙන් ඉල්ලුම්කර සිටිය හැක.

5. මේ ගැසට් පත්‍රයේ IV වෙනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. **ඉල්ලුම්පත්‍ර.**—පත්කිරීම සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 1973.02.26 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලන ආයතනයක, නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත, අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. යෝග්‍යතා ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1973 ජනවාරි මස 17 දින,
තැ. පෙ. 530, කොළඹ,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

1–965—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

ා

## පශු ඕවර්සියර් තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත්‍ර කැඳවයි. තෝරාගනු ලබන අයදුම්කරු පළමුවරට කොළඹ නගර සභාවේ පශු වෛද්‍ය දෙපාර්තමේන්තුවට පත් කරනු ලැබේ.

2. වැටුප.—තනතුරට නියමිත ඒකාබද්ධ වැටුප් ක්‍රමය : රු. 3,000.—10×90—3,900—4,008—9×144—රු. 5,304 වේ. මෙහි රු. 4,008 වාර්ෂික වැටුපට පෙර කාර්යක්ෂමතා කඩඉමක් වේ.

3. අවශ්‍ය සුදුසුකම්.—

(අ) වයස : 1973.02.26 දිනට වයස අවුරුදු 25 ට නොවැඩි විය යුතුය.

(ආ) අයදුම්කරුවෝ පහත සඳහන් විභාගවලින් සමත් වී සිටිය යුත්තාහ :—

සත්ව විද්‍යාව හා උද්භිද විද්‍යාව යන විෂයයන් සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්

හෝ

පහත සඳහන් විෂයයන් ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 6කින් සමත්ව, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයෙන් සමත් වී සිටිය යුත්තාහ :—

(i) සිංහල/දෙමළ
(ii) අංක ගණිතය/ගණිතය, සහ
(iii) සත්ව විද්‍යාව සහ උද්භිද විද්‍යාව.

4. මෙම ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර ඇති පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධව යෙන් අදාලවන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම්පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 1973.02.26 දිනට හෝ ඊට පෙර පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

6. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාර ගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

7. සුදුසුකම් ඇත් අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1973 ජනවාරි මස 17 දින,
තැ. පෙ. 530, කොළඹ.

1–964—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

## සහකාර වෛද්‍ය නිලධාරී (මාතෘ හා ළමා ශුභ සාධක) තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි. තෝරාගනු ලබන අයදුම්කරු පළමුවරට යාපනය නාගරික සභාවේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පත් කරනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රු. 9,600—360×4—480×11—රු. 16,320, වර්ෂයකට රු. 14,880 වේ. ඇමුරුදු නැවැත්මක් ඇත. ඩී.සී.එච්. හෝ ඩී.ආර්.සී.ඕ.ජී. හෝ ලංකා ඇම්.ඕ.ජී. සුදුසුකම් නොලත් නිලධාරියෙකුට වර්ෂයකට රු. 14,880 යන වැටුපෙන් ඔබ්බට යා නොහැක. රජයේ නිලධාරීන්ට අදාල ප්‍රමාණයන් සහ කොන්දේසි අනුව විවාහක දීමනාවක්ද, විවාහක නිලධාරීන්ට ගෙවනු ලැබේ.

3. රජයේ ප්‍රමාණයන් අනුව විශ්‍රාම වැටුප් රහිත දීමනා ගෙවනු ලැබේ.

4. මෙම ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර (ලංකා) උපාධිය හෝ ලංකා වෛද්‍ය සභාව විසින් ලියාපදිංචි කළ හැකි වෙනත් සාමාන්‍ය වෛද්‍ය සුදුසුකම් තිබිය යුතුයි. ළමා සුභ සාධනය පිළිබඳව පළපුරුද්දක් ඇති අයට විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

5. තෝරාගනු ලබන අයදුම්කරුට ප්‍රාදේශීය බලමණ්ඩල සීමාව තුළ වාසය කිරීමට නියම කරන අතර, පෞද්ගලික වෘත්තියෙහි යෙදීමට අවසර නැත.

6. මේ ගැසට් පත්‍රයේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

7. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට, 1973.03.12 දිනට හෝ ඊට පළමු මා වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. සඳහන් ආකෘති පත්‍රයේ 13 වැනි ඡේදය වෙනුවට පහත සඳහන් කරුණු යොදාගත යුතුය :—

(අ) ලබා ඇති වෛද්‍ය සහ වෘත්තීය සුදුසුකම්, ඒවා ලබාගත් දින, වකවානු සහ ආයතනයන්ගේ නම් සහිතව :———.

(ආ) මාතෘ හා ළමා ශුභ සාධනය පුහුණුව පිළිබඳ විස්තර :———.

8. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාතීමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

9. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අයදුම් පත් භාරගන්නා අවසාන දිනට ප්‍රථම ලැබී ඇති බවට සහතික කර, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

10. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

එඩ්ගා ප්‍රනාන්දු,
ලේකම්,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව.

1973. 01. 16,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කායඨාලය,
තැ. පෙ. 530,
කොළඹ.

1–963—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

**කුඩාගල්බොඩ ගම්සභාව—කාර්යාල කාර්ය සහායක තනතුර**

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—

වර්ෂයකට රුපියල් 540—30×8—24×1 රු. 804 රු. 636 සහ රු. 732 යන වාර්ෂික වැටුප් වලට පළමු කායසීක් ඍමතා කඩඉම් ඇත.

3. අවශ්‍ය සුදුසුකම්.—

(අ) ඉල්ලුම්කරු ලාංකිකයෙකු විය යුතුය.

(ආ) 1973 පෙබරවාරි මස 28 දිනට වයස අවුරුදු 20ට නො අඩු හා 30ට නොවැඩි විය යුතුය. එහෙත් දැනට පළාත් පාලන ආයතනවල හා රජයේ ස්ථිර සේවකයන් සම්බන්ධයෙන් උපරිම වයස සීමාව බලනොපැවැත්වේ.

(ඇ) අපේක්ෂකයා අඩුවශයෙන් සිංහල/දෙමල 6 වැනි ප්‍රමාණය සමත්ව සිටිය යුතුය.

(ඈ) යහපත් චරිතයක් ඇත්තෙකු විය යුතුය. (මෑත දී ලබාගත් චරිත සහතික දෙකක් ඉදිරිපත් කළ යුතුය. එකක් ප්‍රදේශයේ ග්‍රාම සේවක නිලධාරියාගෙන් විය යුතුය.)

එසේම දණ්ඩ නීති සංග්‍රහය යටතේ වරදකට වරදකරු වූ හෝ ආණ්ඩුවේ හෝ වෙනත් ප්‍රාදේශීය බල මණ්ඩලයක හෝ යම් නීති ගත සංස්ථාවක හෝ දඬුවම් වශයෙන් සේවයෙන් අස් කළාවූ හෝ අයගෙන් ලැබෙන අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

5. පත්වීම සම්බන්ධයෙන් ගම් සභාවේ සාමාජිකයෙකුගෙන් තමා හෝ අනුන් ලවා හෝ උදව් ගැනීම හෝ ගැනීමට තැත් කිරීම ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වනු ඇත.

6. මෙම තනතුර ගම් සභා සේවක අර්ථ සාධක අරමුදලට යටත් වෙයි.

7. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් අදාල සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

8. ඉල්ලුම් පත්‍ර පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට, 1973 පෙබරවාරි මස 28 දිනට හෝ ඊට පළමු කුඩාගල්බොඩ ගම්සභාවේ සභාපතිතුමා වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ඊ. බී. රාමනායක,
කුඩාගල්බොඩ ගම්සභාවේ සභාපති.

1973 ජනවාරි මස 13 දින,
කුඩාගල්බොඩ ගම්සභා කායසීලය,
කුඩාගල් ගමුව.

01–1029—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**පළාත් පාලන සේවයේ IV වැනි ශ්‍රේණියේ විදුලිය අධිකාරීන් සඳහා බඳවා ගැනීමේ විභාගය—1972.05.20**

1972.09.29 දින ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පලකරන ලද නම්වලට අමතරව පහත නම් සඳහන් අපේක්ෂකයින්ද ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල අනුව IV වැනි ශ්‍රේණියේ විදුලි අධිකාරීන්ගේ තනතුරුවලට පත්කිරීම සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් තෝරා ගන්නා ලද බව මෙයින් දන්වනු ලැබේ.

(1) වී. ගෝපාලක්‍රිෂ්ණ
මහතා ... යාපනය නාගරික සභාව.

(2) බී කේ. මුනිදාස මහතා ... මීගමුව නාගරික සභාව.

(3) ඒ. කන්දසාමි මහතා ... ත්‍රිකුණාමලය ප. ආ. සභාව

(4) එල්. එල්. පෙරේරා
මහතා ... වැල්ලව ගම් සභාව.

(5) එම්. බී. කේ. ගුණතිලක
මහතා ... කැළණිය සු. න. සභාව.

(6) එල්. බී. ඩබ්. මර්වින්
මහතා ... අහංගම සු. න. සභාව.

(7) ඊ. නාමරත්න මහතා ... පානදුර ප. ආ. සභාව.

(8) ඩී. එම්. අතුකෝරාල
මහතා ... කෝට්ටේ ප. ආ. සභාව

(9) ඩබ්. කේ. ක්‍රිස්ටෝපර්
මහතා ... කලුතර ප. ආ. සභාව.

මෙම අපේක්ෂකයින්ට වහාම පත්වීම් ලබාදීමට කොමිෂන් සභාව භාරගනු නොලැබේ. පුරප්පාඩු ඇතිවූ විට ඔවුනට පත්වීම් දෙනු ලැබේ.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1972 ජනවාරි මස 15 දින,
තැ. පෙ. 530—කොළඹ,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

01–962—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

# අතුරු ව්‍යවස්ථා

**අළුත්ගම සුළු නගර සභාව**

සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 හා 156 දරණ වගන්ති යටතේ අළුත්ගම සුළු නගර සභාව විසින් සම්පාදිතව, ඒ ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, එතුමා විසින් අනුමත කරණ ලද අතුරු ව්‍යවස්ථා.

පී. සිරිවර්ධන,
අතිරේක ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

1973 ජනවාරි 9 වැනි දින,
කොළඹදීය.

**අතුරු ව්‍යවස්ථා**

1954 ඔක්තෝබර් මස 22 වැනි දින අංක 10,726 දරණ ගැසට් පත්‍රයෙහි පළකොට වරින් වර සංශෝධනය කරණ ලද්දාවූ අළුත්ගම සුළු නගර සභාවේ පොදු වෙළඳ පොළ පිළිබඳ අතුරු ව්‍යවස්ථාවෙහි ''බී'' උපලේඛනය වෙනුවට පහත සඳහන් උපලේඛනය ආදේශ කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

''බී'' උපලේඛනය

(අතුරු ව්‍යවස්ථා 6)

| ගාස්තු | | මාසික බද්ද රු. ශ. |
|---|---|---|
| කඩකාමර අංක 1 | ... | 37 50 |
| කඩකාමර අංක 2 | ... | 37 50 |
| කඩකාමර අංක 3 | ... | 37 50 |
| කඩකාමර අංක 4 | ... | 37 50 |

බී උපලේඛනය

(අතුරු ව්‍යවස්ථා 6)

ගාස්තු

| | මාසික බද්ද රු. ශ. | | මාසික බද්ද රු. ශ. |
|---|---|---|---|
| කඩකාමර අංක 5 | ... 37 50 | කඩකාමර අංක 31 | ... 19 0 |
| කඩකාමර අංක 6 | ... 37 50 | කඩකාමර අංක 32 | ... 19 0 |
| කඩකාමර අංක 7 | ... 25 0 | කඩකාමර අංක 33 | ... 38 0 |
| කඩකාමර අංක 8 | ... 7 50 | කඩකාමර අංක 34 | ... 15 0 |
| කඩකාමර අංක 9 | ... 25 0 | කඩකාමර අංක 35 | ... 25 0 |
| කඩකාමර අංක 10 | ... 25 0 | කඩකාමර අංක 36 | ... 25 0 |
| කඩකාමර අංක 11 | ... 25 0 | කඩකාමර අංක 37 | ... 53 50 |
| කඩකාමර අංක 12 | ... 25 0 | කඩකාමර අංක 38 | ... 53 50 |
| කඩකාමර අංක 13 | ... 25 0 | කඩකාමර අංක 39 | ... 53 50 |
| කඩකාමර අංක 14 | ... 25 0 | කඩකාමර අංක 40 | ... 28 50 |
| කඩකාමර අංක 15 | ... 32 50 | කඩකාමර අංක 41 | ... 42 50 |
| කඩකාමර අංක 16 | ... 32 50 | කඩකාමර අංක 41 (ඒ) | ... 225 0 |
| කඩකාමර අංක 17 | ... 32 50 | එලවළු මැසි අංක එස් 1 | ... 15 0 |
| කඩකාමර අංක 18 | ... 19 0 | එලවළු මැසි අංක එස් 2 | ... 15 0 |
| කඩකාමර අංක 19 | ... 60 0 | එලවළු මැසි අංක එස් 3 | ... 15 0 |
| කඩකාමර අංක 20 | ... 90 0 | එලවළු මැසි අංක එස් 4 | ... 15 0 |
| කඩකාමර අංක 21 | ... 90 0 | එලවළු මැසි අංක එස් 5 | ... 15 0 |
| කඩකාමර අංක 22 | ... 60 0 | එලවළු මැසි අංක එස් 6 | ... 15 0 |
| කඩකාමර අංක 23 | ... 60 0 | එලවළු මැසි අංක එස් 7 | ... 15 0 |
| කඩකාමර අංක 24 | ... 90 0 | එලවළු මැසි අංක එස් 8 | ... 15 0 |
| කඩකාමර අංක 25 | ... 90 0 | පළා මැසි අංක එස් 9 | ... 3 0 |
| කඩකාමර අංක 26 | ... 60 0 | එලවළු මැසි අංක එස් 10 | ... 15 0 |
| කඩකාමර අංක 27 | ... 90 0 | එලවළු මැසි අංක එස් 11 | ... 15 0 |
| කඩකාමර අංක 28 | ... 19 0 | එලවළු මැසි අංක එස් 12 | ... 15 0 |
| කඩකාමර අංක 29 | ... 19 0 | හුණු මැසි අංක එස් 13 | ... 3 0 |
| කඩකාමර අංක 30 | ... 19 0 | | |

01–876—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරිය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ කොස්ගොඩ ගම්සභා ප්‍රදේශයේ ගම්සභාව විසින් පනවනු ලැබ, ඒ වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද ව්‍යවස්ථා.

ෂී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ
අතිරේක ලේකම්.

1973. 1. 6 වැනි දින,
කොළඹ දී ය.

අතුරු ව්‍යවස්ථා

**වෙළඳ පොලවල් සහ පොළවල්**

1. සභාව විසින් පිළිගන්නා ලද වෙළඳ පොළවල් හා පොළවල් පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාවල 27 වැනි කොටසේ 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා අහුන්ගල්ල පොදු වෙළඳ පොළ සඳහා වෙළඳ ප්‍රදේශය වෙළඳ පොලේ සිට සැතපුම් භාගයක අර්ධ විශ්කම්භයක් ඇති කවයක් ඇතුළත වූ ප්‍රදේශය විය යුතුය.

| 31. | රබර් ෂීට්, ක්‍රෙප් රබර් සෑදීම හෝ දුම් ගැසීම ... | 15 | 0 |
| 32. | සෙක්කුවලින් තෙල් සිඳීම ... ... | 10 | 0 |
| 33. | පැඟිරි තෙල් සෑදීම ... ... ... | 100 | 0 |
| 34. | කෙඳි වර්ග නෙලීම හෝ ගබඩා කිරීම ... ... | 25 | 0 |
| 35. | ලී මඩුවක් තබාගැනීම ... ... | 25 | 0 |
| 36. | භූමි තෙල් ගබඩා කිරීම ... ... ... | 25 | 0 |
| 37. | මුද්‍රණ යන්ත්‍රයක් සහිත මුද්‍රණාලයක් පවත්වාගෙන යෑම :— | | |
| | (අ) විදුලි බලයෙන් ක්‍රියා කරන ... ... | 80 | 0 |
| | (ආ) වෙනත් අන්දමින් ක්‍රියාකරන ... ... | 25 | 0 |
| 38. | තේකොළ ගබඩා කිරීම ... ... | 10 | 0 |
| 39. | අම්ලකර වායුව පාවිච්චිකරන කම්හලක් පවත්වාගෙන යෑම | 25 | 0 |
| 40. | හාල් මෝලක් හෝ වී කොටන මෝලක් පවත්වාගෙන යෑම— | | |
| | (අ) පළමුවැනි වර්ගය ... ... | 100 | 0 |
| | (ආ) දෙවැනි වර්ගය ... ... ... | 25 | 0 |
| 41. | ගඩොල් හෝ හුණු පිච්චීම ... ... | 40 | 0 |
| 42. | සිසිල් බීම සෑදීම ... ... ... | 100 | 0 |
| 43. | පුද්ගලික වෙළඳාම් පොලක් හෝ කඩ පොලක් පවත්වා ගෙන යෑම ... ... ... | 100 | 0 |
| 44. | යන්ත්‍ර මගින් ලී ඉරන, ඉරුම් මෝලක් පවත්වාගෙන යෑම ... | 200 | 0 |
| 45. | බයිසිකල් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම | 5 | 0 |
| 46. | වඩු මඩුවක් තබා ගැනීම ... ... | 5 | 0 |
| 47. | බෙලෙක් වැඩ කරන ස්ථානයක් තබාගැනීම ... | 15 | 0 |
| 48. | මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ වැඩපොලක් පවත්වාගෙන යෑම ... ... ... | 40 | 0 |
| 49. | ලී බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම ... | 25 | 0 |
| 50. | රෙදි පිරිසිදු කරන ස්ථානයක් පවත්වාගෙන යෑම ... | 10 | 0 |
| 51. | ගුවන් විදුලි යන්ත්‍ර සෑදීම හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම ... ... ... | 20 | 0 |
| 52. | ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යෑම ... | 30 | 0 |
| 53. | කරනැවැම් මැදිරියක් (බාබර් සාප්පුවක්) පවත්වාගෙන යෑම | 20 | 0 |
| 54. | ස්වර්ණාභරණ සෑදීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම ... | 15 | 0 |
| 55. | මිණී පෙට්ටි සෑදීම හෝ ගබඩා කිරීම ... ... | 30 | 0 |
| 56. | රබර් තොග ගබඩා කිරීම ... ... | 25 | 0 |
| 57. | යකඩ, තඹ, පිත්තල සහ ඇලුමිනියම් ආදී ලෝහ බඩු වර්ග වෙළඳාම ... ... ... | 25 | 0 |
| 58. | සීත කරන ලද මාළු හෝ මස් විකිණීම ... ... | 25 | 0 |
| 59. | හිස් බෝතල් සහ හිස් ගෝනි ගබඩා කර තබාගැනීම ... | 25 | 0 |
| 60. | පෝර නිපදවීම හෝ ගබඩා කිරීම ... ... | 25 | 0 |
| 61. | හුණු ගබඩා කිරීම ... ... ... | 15 | 0 |

1–538—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

### කෙසෙල්වත්ත සුළු නගර සභාව

1973 වර්ෂයට වරිපනම් ලේඛන

1973 වර්ෂය සඳහා වූ මෙම සුළු නගර සභාවේ වරිපනම් බදු ලේඛන දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛන කාර්යාල වෙලාවන්හිදී මහජනයාට පරීක්ෂාකර බැලීම සඳහා තබා ඇති බවත්, (256 වන අධිකාරිය වන) සුළු නගර සභා ආඥාපනතේ 165 වන වගන්තියෙන් කියැවෙන පරිදි (252 වැනි අධිකාරිය වන) මහ නගර සභා ආඥාපනතේ 235 (1) දරණ වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩර්වින් එස්. පෙරේරා,
සභාපති,
කෙහෙල්වත්ත සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
කෙහෙල්වත්ත, පානදුර,
1972. 12. 30 වන දින.

01–640—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

### මාදම්පේ සුළු නගර සභාව

1973 වර්ෂයට දේපල බද්ද පැනවීම

(256 වන අධිකාරය වන) සුළු නගරසභා ආඥාපනත යටතේ, 1972 වර්ෂයට බලපවත්නා පහත සඳහන් දේපල බදු 1973 වර්ෂයට ද එලෙසම පැනවීමට මාදම්පේ සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 වැනි වගන්තියේ ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුල පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින්වූ වාර්ෂික බද්ද පිළිවෙලින් මාර්තු 31, ජූනි 30 සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වෙනිදායින් අවසන් වන පරිදි කාර්තු වශයෙන් ගෙවිය හැකිවේ.

ඇස්. සේගු ඊබ්‍රහිම්,
සභාපති, මාදම්පේ සුළු නගර සභාව.

1973 ජනවාරි මස 6 වැනිදා,
මාදම්පේ සුළු නගර සභා කාර්යාලයේදී.

01–738/1—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

### මාදම්පේ සුළු නගර සභාව

මළ බැහැරලීමේ විශේෂ බද්ද—1973 වර්ෂය

(256 වැනි අධිකාරිය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) වැනි වගන්තිය යටතේ සහ එකී වගන්තියෙන් පළාත් පාලනය පිළිබඳ ඇමතිවරයා කෙරෙහි පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් දෙන ලද අනුමැතිය ඇතිව, අතුරු ව්‍යවස්ථාවලින් නිමකල හැකි සීමා කිරීම් සහ නිදහස් කිරීම් වලට යටත්ව මාදම්පේ සුළුනගරය තුල පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට තුන බැගින් වූ කශල ශෝධනය පිළිබඳ විශේෂ බද්දක් 1973 වර්ෂයටද පනවා ඇති බවත්, පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වෙනිදායින් අවසන් වන අයුරු සමාන කොටස් හතරකින් ගෙවිය හැකි බවත් නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඇස්. සේගු ඊබ්‍රහිම්,
සභාපති, මාදම්පේ සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
මාදම්පේ.
1973 ජනවාරි මස 6 වැනිදා.

01–738/2—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

### මාදම්පේ සුළු නගර සභාව

1973 වර්ෂය සඳහා රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද

256 වෙනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනත

මාදම්පේ සුළු නගර සභාව විසින් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ

(1) 256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත උපලේඛනයේ විස්තර වන ගණන් අනුව, 1973 අවුරුද්දට රථ වාහන හා සතුන් සඳහා බද්දක් පනවා අය කිරීමටද,

(2) එකී ආඥාපනතේ 162 (3) වගන්තිය යටතේ, එකී බදු 1973 මාර්තු 31 වෙනිදාට හෝ ඊට පෙර ගෙවිය හැකි අයුරින්ද වේ.

උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, ජින් රික්ෂෝ රථ, පා පැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර යම් ඕනෑම වාහනයක් සඳහා ... ... ... | 5 | 0 |
| ඕනෑම පාපැදියක්, රෝදත්‍රයේ පා පැදියක් හෝ පා පැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නොහොත් රෝදත්‍රයේ පාපැදියක් හෝ මෝටර් රථයක් හෝ කරත්තයක් ... ... ... | 5 | 0 |
| (අ) වෙළඳ කාර්යයන් සඳහා පාවිච්චි කෙරේ නම්... | 5 | 0 |
| (ආ) වෙළඳ කාර්යයන් හැර වෙන ඕනෑම කටයුත්තකට පාවිච්චි කෙරේ නම් ... ... | 1 | 0 |
| ඕනෑම අන්දමක ගොන් දෙන්නා බඳින බර කරත්තයකට හෝ තිරික්කලයකට ... ... | 1 | 0 |
| ඕනෑම අන්දමක තනි ගොනා බඳින කරත්තයකට හෝ තිරික්කලයකට ... ... | 4 | 0 |
| ඕනෑම අත් කරත්තයකට ... ... | 2 | 50 |
| ඕනෑම ජින් රික්ෂෝ රථයකට ... ... | 2 | 50 |
| ඕනෑම අශ්වයෙකුට, අශ්ව තරයෙකුට හෝ කොටලුවෙකුට... | 5 | 0 |
| ඕනෑම බූරුවෙකුට හෝ ගොනෙකුට ... ... | 1 | 0 |

ඇස්. සේගු ඊබ්‍රහිම්,
සභාපති, මාදම්පේ සුළු නගර සභාව.

1973 ජනවාරි 6 වැනි දින,
මාදම්පේ සුළු නගර සභා කාර්යාලයේදීය.

01–738/3—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

### මාදම්පේ සුළු නගර සභාව

1973 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත

(477 වනි අධිකාරය)

477 වන අධිකාරය වන සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 4 වන වගන්තිය ප්‍රකාර මාදම්පේ සුළු නගර සභා බල මණ්ඩලය තුල ඇතිගෙන සිටින සෑම පිරිමි සුනඛයෙකු සඳහා රු. 1.00 බැගින්ද ගැහැණු සුනඛයෙකු සඳහා 1.50 බැගින්ද, 1973 මාර්තු 31 වෙනිදාට හෝ ඊට පෙර ගෙවන අයුරින් ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් 1973 වර්ෂයට අය කිරීමට පනවා ඇති බව හෝ නත් නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඇස්. සේගු ඊබ්‍රහිම්,
සභාපති, මාදම්පේ සුළු නගර සභාව.

1973 ජනවාරි මස 6 වැනිදා,
මාදම්පේ සුළු නගර සභා කාර්යාලයේදීය.

01–738/4—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

### මාදම්පේ සුළු නගර සභාව

1973 වර්ෂයේ වරිපනම් ලේඛන

1973 වර්ෂය වෙනුවෙන් පිළියෙල වී ඇති මාදම්පේ සුළු නගර සභා සීමාවේ වරිපනම් ලේඛන රාජකාරි වේලාවන් තුල මෙම කාර්යාලයේදී පරීක්ෂා කිරීම පිණිස විවෘතව ඇති බව (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 165 වැනි වගන්තියේ කියවෙන (252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 235 (1) වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇස්. සේගු ඊබ්‍රහිම්,
සභාපති, මාදම්පේ සුළු නගර සභාව.

1973 ජනවාරි මස 6 වැනිද,
මාදම්පේ සුළු නගර සභා කාර්යාලයේ දීය.

01–738/5—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

### හික්කඩුව සුළු නගර සභාව

ගෝඝාතක ආඥා පනත

මෙහි පහත උප ලේඛනයේ නම් සඳහන් අය එකී සඳහන් ස්ථානයේ 1973 වර්ෂයට එළහරක් මස් කඩයක් පවත්වාගෙන යාම සඳහා අවසර පත්‍රයක් ඉල්ලා අයදුම් පතක් මා වෙත එවා තිබෙන බව (272 වැනි පරිච්ඡේදය) වන ගෝ ඝාතන ආඥාපනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම බලපත්‍රය නිකුත් කිරීම ගැණ ගාලු දිස්ත්‍රික්කයේ හික්කඩුව ප්‍රදේශයේ හික්කඩුව සුළු නගර සභා සීමාව තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය විරුද්ධ වනුයේ කුමන හේතුව නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

එච්. වී. එල්. ඩී. ගුණසිංහ,
වැ.බ. සභාපති,
හික්කඩුව සුළු නගර සභාව.

1973.1.3 වැනි දින,
හික්කඩුව සුළු නගර සභා කායාීලයේදීය.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| එම්. රවුප් මහතා, අංක 75/50, මාලිගාකන්ද, මරදාන, කොළඹ 10 | එළහරක් මස් වෙළඳාම ... | හික්කඩුව පාරේ අංක 208, ස්ථානයේ පිහිටි, පොදු වෙළඳ පොල එළහරක් මස් කඩය |

01–533—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

### හෙනරත්ගොඩ ගමසභාව

ශ

මෙහි පහත උප ලේඛනයේ නම් සඳහන් අය එකී උප ලේඛනයේ සඳහන් ස්ථානවල 1973 ජනවාරි 1 වෙනි දින සිට 1973 දෙසැම්බර් 31 වැනි දින දක්වා කාලයේ මස් විකිණීම සඳහාත් සතුන් ඝාතනය කිරීම සඳහාත්, අවසර ඉල්ලා අයදුම්පත් මා වෙත එවා තිබෙන බැව් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනතේ 272 වෙනි පරිච්ඡේදයේ 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම බලපත්‍ර නිකුත් කිරීම ගැන කොළඹ දිස්ත්‍රික්කයේ හෙනරත්ගොඩ ගමසභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධවන්නේ නම් ඔහු හෝ ඈ ඊට විරුද්ධ වනුයේ කුමන කරුණක් නිසා ද යන වග සඳහන් ලියවිල්ලක් පිටපතක් ද සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත දී මා වෙත එවිය යුතු බැව් මෙයින් දැනුම් දෙමි.

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ව්‍යාපාරය | ස්ථානය |
|---|---|---|---|
| 1. | ජේ. ඒ. දොන් මයිකල්, බොල්ලත, බොල්ලතේගම | එළහරක් හා ඌරු මස් වෙළඳාම ... | ගණේමුල්ල වෙළඳපොලේ අංක 1 දරණ මස්කඩය |
| 2. | ජේ. ඒ. දොන් මයිකල්, බොල්ලත, බොල්ලතේගම... | එළහරක් හා ඌරු මස් වෙළඳාම ... | ගණේමුල්ල වෙළඳ පොළේ අංක 2 දරණ මස්කඩය |
| 3. | ඇල්. ඩී. පිලිප් විල්සන්, කැප්පිටියාවත්ත, මුදුන්ගොඩ | එළහරක් හා ඌරු මස් වෙළඳාම ... | මොරගොඩ මිල්ලගහ නමැති ඉඩමේ පිහිටි ගමසභාව සතු කඩ කාමරය |
| 4. | නිමල් දිසානායක, 215, " නිර්මලා ", වැලිවේරිය ... | එළහරක් මස් වෙළඳාම ... | වැලිවේරිය වෙළඳ පොලේ අංක 1 දරණ මස් කඩය |
| 5. | ජේ. ඒ. දොන් විල්ෆ්‍රඩ්, බොල්ලත, බොල්ලතේගම... | එළහරක් මස් වෙළඳාම ... | වැලිවේරිය වෙළඳ පොළේ අංක 2 දරණ මස් කඩය |
| 6. | එච්. ලාවුස් පෙරේරා, 42, නැදුන්ගමුව, වැලිවේරිය... | ඌරු මස් වෙළඳාම ... | වැලිවේරිය වෙළඳ පොළේ අංක 3 දරණ මස් කඩය |
| 7. | ඩී. ඒ. රංජිත්, අංක 3, කිඩගම්මුල්ල, ගම්පහ ... | එළහරක් හා ඌරු මස් වෙළඳාම ... | කිඩගම්මුල්ලේ පිහිටි ගමසභාවට අයත් මස් කඩය |
| 8. | එල්. ඩී. පිලිප් විල්සන්, කැප්පිටියාවත්ත, මුදුන්ගොඩ | එළහරක් හා ඌරු මස් වෙළඳාම ... | මුදුන්ගොඩ " අමුණුදූන්නේ කුඹුරෙන් ගොඩකළ ඉඩමේ " පිහිටි ගමසභාව සතු කඩ කාමරය |
| 9. | ඩී. ඒ. ප්‍රැන්සිස් සේවියර්, " පියසිරි නිවස ", කිඩගම් මුල්ල, ගම්පහ | එළහරක් මස් වෙළඳාම ... | බැණ්ඩියමුල්ල " අඹගහවත්ත " නමැති ඉඩමේ ගම් සභාව සතු කඩ කාමරය |
| 10. | ජේ. ඒ. ඇඩ්මන්, බොල්ලත, බොල්ලතේගම ... | එළහරක් හා ඌරු මස් වෙළඳාම ... | පහල ඉඹුල්ගොඩ " කොකිස්කඩේ " හන්දිය අසල පිහිටි කඩ කාමරය |
| 11. | ඇල්. ඩී. පිලිප් විල්සන්, කැප්පිටියාවත්ත, මුදුන්ගොඩ | ගෝඝාතනය ... | මුදුන්ගොඩ පිහිටි ඩබ්ලිව්. ඒ. පෙසෝනාහාමිට අයත් " මරඳගහලන්ද " නැමති ඉඩමේ පිහිටි ගෝඝාතක ස්ථානය |
| 12. | ඩී. ඒ. ප්‍රැන්සිස් සේවියර්, කිඩගම්මුල්ල, ගම්පහ ... | ගෝඝාතනය ... ... | කිඩගම්මුල්ලේ " මීගහවත්ත " නමැති ඉඩමේ පිහිටි ඉල්ලුම්කරුට අයත් සතුන් මරණ ස්ථානය |
| 13. | ඩී. ඒ. රංජිත්, අංක 3, කිඩගම්මුල්ල, ගම්පහ ... | එළහරක් හා ඌරන් ඝාතනය කිරීම | කිඩගම්මුල්ලේ " මීගහවත්ත " නමැති ඉඩමේ පිහිටි ඉල්ලුම්කරුට අයත් සතුන් මරන ස්ථානය |
| 14. | නිමල් දිසානායක, 215, " නිර්මලා ", වැලිවේරිය ... | ගෝඝාතනය ... ... | වැලිවේරියේ " කෝපිහේනවත්ත " නමැති ඉඩමේ පිහිටි ඉල්ලුම්කරුට අයත් සතුන් මරණ ස්ථානය |

කේ. ඒ. ඩී. ප්‍රේමචන්ද්‍ර කළුගම්පිටිය,
සභාපති.

1973 ජනවාරි මස 8 වැනි දින,
හෙනරත්ගොඩ ගමසභා කාර්යාලයේ දීය,
මුදුන්ගොඩ.

01–930—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

## ආනවිලුන්දන් පත්තු ගම්සභාව

සෝඝාතන ආඥපනත (272 වැනි අධිකාරය)

මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි නම් සඳහන් අයවළුන් විසින්, ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් කර ඇති ස්ථානවල මස් පිණිස සතුන් මරා, මස් විකිණීම සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බව ගෝඝාතන ආඥපනතේ (272 අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

එකී බලපත්‍රයන් 1973 වර්ෂය සඳහා නිකුත් කිරීම ගැන ආනවිලුන්දන් පත්තු ගම් සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධවීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින දහහතරක් ඇතුළත දීමා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් දනුම් දෙනු ලැබේ.

උප ලේඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඇස්. ඒ. පබිලිස් අප්පුහාමි, අංක 80, විජය කටුපොත, මුන්දලම | හරක් මස් ... | අංක 80, විජය කටුපොත |
| පී. දොන් සිපිරියානු අප්පුහාමි, ආරච්චිකට්ටුව, රාජකදලුව ... | ඌරු මස් ... | ආරච්චිකට්ටුව, කුසලවත්ත හන්දියේ පිහිටි මස් වෙළඳහල |
| ජී. එඩ්මන් සිල්වා, හැලඹවටවන, නල්ලදරන්කට්ටුව ... | හරක් මස් ... | සංගුතවිටාන, දුම්රිය හරස් පාර අසල පිහිටා ඇති ඒ. එච්. ආර්. මරික්කාර් මහතාට අයත් ඉඩමේ පිහිටි මස් වෙළඳහල |
| ඩබ්ලිව්. ජෙනෝසියස් ප්‍රනාන්දු, කෝට්ටපිටිය, බංගදෙනිය ... | හරක් මස් ... | කෝට්ටපිටිය හන්දියේ පිහිටි මස් වෙළඳහල |

එම්. ඩී. යාපා,
ආනවිලුන්දන් පත්තු ගම් සභාව.

ගම් සභා කාර්‍යාලය,
ආරච්චිකට්ටුව, රාජකදළුව.
72.12.8.

1–534—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

## ඉඳුරුව ගම් සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උප ලේඛණයේ සඳහන් අය විසින් එකී උපලේඛනයේ සඳහන් සථානයේ 1973 වර්ෂයට මස්කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බැවින් එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන ඉඳුරුව ගම්සභා ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධවීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුක්තව, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14 ක් ඇතුළත මාවෙත ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 (2) වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ සහ නම ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| ඩී. ඇන්. අල්ගම 'අජානි' මහඉඳුරුව, ඉඳුරුව ... ... ... | හබක්කල ... | එළුමස් සහ හරක් මස් |

ඩබ්ලිව්. ඩී. ගුණරත්න,
ඉඳුරුව ගම්සභාවේ සභාපති.

1972.12.22 වන දින,
ඉඳුරුව ගම්සභා කාර්යාලයේ දීය.

1–823—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

## අතුරුගිරිය ගම් සභාව

ගෝඝාතක ආඥපනත

මෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන අය විසින් ගවඝාතක මඩුවක් පවත්වාගෙන යාම සඳහා 1973 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන, ඇතුරුගිරිය ගම්සභා සීමාව තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධවීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක්, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මාවෙත ලියා එවිය යුතු බවත්, ගෝඝාතක ආඥාපනතේ (272 අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරු | ලිපිනය | ගවඝාතන මඩුව පවත්වන සථානය |
|---|---|---|
| 1. ආර්. ඇස්. අබ්දුල් කාදර්, ... ... ... ... | මාර්කට්, හෝමාගම ... | වැලිකඩයාවත්තේ උඩහේන ලන්ද |

එච්. ඇස්. පෙරේරා,
සභාපති, අතුරුගිරිය ගම්සභාව.

ගම්සභා කාර්යාලය,
වල්ගම,
අතුරුගිරිය,.
1972.12.27.

1-353—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

**කොළඹ දිස්ත්‍රික්කයේ පමුණුගම ගම් සභාව**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 අධිකාරය)

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් 1973 පෙබරවාරි මස 15 දින සිට 1972 දෙසැම්බර් 31 දින දක්වා එළහරක් මස් කඩයක් පවත්වාගෙන යාම පිණිස බලපත්‍රයක් ඉල්ලුම්කර සිටින බවත්, ඒ අනුව බලපත්‍රය නිකුත් කිරීම ගැන පමුණුගම සම්සභා ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇ එසේ විරුද්ධ වීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුක්තව ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (272 වන අධිකාරය) 7 (2) (ආ) වෙනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරන අයගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| ලියනගේ දොන් ඇන්ටනි, මාටගොඩ, හැඳල, වත්තල ... | ... උස්වැටකෙයියාව රා තැබැරුම් අසල ... | එළහරක් මස් |

**කේ. එම්. අබේසිංහ,**
**පරිපාලන නිලධාරි, පමුණුගම ගම්සභාව.**

**1973 ජනවාරි මස 19 දින,**
**පමුණුගම පරිපාලන කාර්යාලයේදීය,.**
**දුරකථනය, ජා ඇල 256.**

**1-1063—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය**

---

**ගලහිටියාව ගම්සභාව**

මෙහි පහත උපලේඛනයේ දැක්වෙන අය විසින් 1973 වර්ෂයට මස් පිණිස සතුන් මැරීමට හා මස් කඩ පවත්වා ගෙන යාමට බලපත්‍ර ඉල්ලුම් කර සිටින බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන ගලහිටියාව ගම්සභා සීමාව තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධවන්නේ නම් එසේ විරුද්ධවීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළකිරීමේ දින සිට දින 14ක් ඇතුළත දී මා වෙත ලියා එවීමට බලය තිබෙත බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වැනි පරිච්ඡේදයේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | මරණ ස්ථානය | වෙළඳාමේ ස්වභාවය | වෙළඳාම් කරන සථානය |
|---|---|---|---|
| ඊ. පී. සරම් ... | ... බොල්ලත-දෙල්ගහවත්ත නමැති ඉඩම | ...එළහරක් මස්කඩය | ... ගම්පහ-ජාඇල පාරේ පහළගම අංක 105 දරණ ස්ථානය |

**එච්. ඩී ගිල්බට්,**
**ගලහිටියාව ගම්සභාවේ සභාපති.**

**ගම්සභා කායර්‍යාලය,**
**ගලහිටියාව-ගණේමුල්ල.**
**1972.12.30 වෙනි දින.**

**1-357—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය**

---

**දුම්මලසූරිය ගම්ප්‍රදේශයේ පාලන නිලධාරි කාර්යාලය**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වන අධිකාරය

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (272 වන අධිකාරය) 17(1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නිසි බලධරයාවූද, දුම්මලසූරිය ගම් ප්‍රදේශයේ පාලන නිලධාරි තැන වූද, ඔලිවර්. ඇම්. ජේ. පෙරේරා වන මම, 1973 වර්ෂයේදී පහත සඳහන් උපලේඛනයේ සඳහන් දිනවලදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ දුම්මලසූරිය ගම්ප්‍රදේශ සීමාව තුල මස් පිණිස සතුන් මැරීම සම්පූර්ණයෙන්ම මෙයින් තහනම් කරමි.

**උපලේඛනය**

1973 ජනවාරි 18 පුරපසළොස්වක පෝය දිනය.
1973 පෙබරවාරි 16 පුරපසළොස්වක පෝය දිනය.
1973 මාර්තු 18 පුරපසළොස්වක පෝය දිනය.
1973 අප්‍රේල් 17 පුරපසළොස්වක පෝය දිනය.
1973 මැයි 16 පුරපසළොස්වක පෝය දිනය.
1973 මැයි 17 වෙසක් දිනට පසු දින.
1973 මැයි 22 ජනරජ දිනය.
1973 ජූනි 15 පුරපසළොස්වක පෝය දිනය.
1973 ජූලි 14 පුරපසළොස්වක පෝය දිනය.
1973 අගෝස්තු 13 පුරපසළොස්වක පෝය දිනය.
1973 සැප්තැම්බර් 12 පුරපසළොස්වක පෝය දිනය.
1973 සැප්තැම්බර් 26 බණ්ඩාරනායක දිනය.
1973 ඔක්තෝබර් 4 ලෝක සත්ව දිනය.
1973 ඔක්තෝබර් 11 පුරපසළොස්වක පෝය දිනය.
1973 නොවැම්බර් 10 පුරපසළොස්වක පෝය දිනය.
1973 දෙසැම්බර් 9 පුරපසළොස්වක පෝය දිනය.

ඔලිවර්. ඇම්. ජේ. පෙරේරා,
දුම්මලසූරිය ගම්ප්‍රදේශයේ පාලන නිලධාරි.

දුම්මලසූරිය ගම්ප්‍රදේශයේ
පාලන නිලධාරි කාර්යාලය,
දුම්මලසූරිය.
1973 ජනවාරි 3 දා.

1–809—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

## කොළඹ දිස්ත්‍රික්කයේ කටාන ගම් සභාව

### ගෝඝාතක ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අයවලුන් විසින් එහි සඳහන් ස්ථානයන්හි මස් වෙළඳාම් කිරීමෙන් ගෝඝාතක ව්‍යාපාරය පවත්වා ගෙන යාම සඳහා 1973 වර්ෂයට බලපත්‍ර ඉල්වා අයදුම් පත් මා වෙත ඉදිරිපත් කර තිබෙන බව ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 (2) වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන කටාන ගම්සභා සීමාව තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇය, එසේ විරුද්ධ වන්නේ කුමන හේතුවක් නිසා ද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුලත මා වෙත එවිය යුතු බව මෙයින් දනුම් දෙමි.

ඩී. ජේ. ප්‍රනාන්දු පුල්ලේ,
සභාපති,
කටාන ගම් සභාව.

1973 ජනවාරි මස 4 වැනි දින,
කටාන ගම්සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | අයදුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | ව්‍යාපාරයේ නම |
|---|---|---|---|
| 1. | ඒ ඩී. පීටර් හලහකෝන්, කඳවල, කටාන ... ... | ගම්සභාව සතු කඩපිල උඩංගාව... | හරක් මස්, එළු මස් සහ ඌරු මස් විකිණීම |
| 2. | ඩබ්ලිව්. ඩී. අගොස්තීනු අප්පුහාමි, කෝන්ගොඩමුල්ල, කටාන | ගම්සභාව සතු කඩපිල, කිඹුලපිටිය | හරක් මස්, එළු මස් සහ ඌරු මස් විකිණීම |
| 3. | එස්. ජී. පීටර් මැක්සිමස් පෙරේරා, මානවේරිය, කොච්චිකඩේ | ගම්සභාව සතු කඩපිල, කටාන පාර, මානවේරිය | හරක් මස්, එළු මස් සහ ඌරු මස් විකිණීම |
| 4. | ඒ. එච්ජින් ප්‍රනාන්දු, මුරුතැන, කොච්චිකඩේ ... | ගම්සභාව සතු කඩපිල, බම්බුකුළිය | හරක් මස්, එළු මස් සහ ඌරු මස් විකිණීම |
| 5. | ටී. අන්තෝනි ප්‍රනාන්දු, නැගෙණහිර කටාන, කටාන ... | ගම්සභාව සතු කඩපිල, නැගෙනහිර කටාන | හරක් මස්, එළු මස් සහ ඌරු මස් විකිණීම |
| 6. | ජී. ඒ. ජේ. පේරේරා, හල්පෙ, කටාන ... ... | ගම්සභාව සතු කඩපිල, බටහිර කටාන | හරක් මස්, එළු මස් සහ ඌරු මස් විකිණීම |
| 7. | කයිතන් බාර්බරා මිරාන්දු මහත්මිය, හලාවත පාර, මානවේරිය, කොච්චිකඩේ | ගම්සභාව සතු කඩපිල, හලාවත පාර, මානවේරිය | හරක් මස්, එළු මස් සහ ඌරු මස් විකිණීම |
| 8. | ඇල්. ජේ. වෙනිස්ටස්, හලාවත පාර, මානවේරිය, කොච්චිකඩේ | ගම්සභාව සතු කඩපිල, දළුව කොටුව | හරක් මස්, එළු මස් සහ ඌරු මස් විකිණීම |
| 9. | ජී. ජී. ප්‍රනාන්දු පුල්ලේ, 44, ඇත්ගාල, කොච්චිකඩේ ... | ගම්සභාව සතු කඩපිල, ඇත්ගාල | හරක් මස්, එළු මස් සහ ඌරු මස් විකිණීම |
| 10. | කේ. ඩී. ඇන්ටනි අප්පුහාමි, 164, මහහුනුපිටිය, මීගමුව ... | ගම්සභාව සතු කඩපිල, මහහුනුපිටිය | හරක් මස්, එළු මස් සහ ඌරු මස් විකිණීම |
| 11. | ඇම්. කේ. ඉබ්‍රාහිම්, 38, රසීක් පරීඩ් මාවත, මීගමුව ... | ගම්සභාව සතු කඩපිල, කට්ටුව (කැබැරුම ඉදිරිපිට) | හරක් මස්, එළු මස් සහ ඌරු මස් විකිණීම |
| 12. | ටී. වික්ටර් පෙරේරා, කඳවල, කටාන ... ... | කඳවල ... | හරක් මස්, එළු මස් සහ ඌරු මස් විකිණීම |
| 13. | ජේ. බෙනඩික් පෙරේරා, 165, මහහුනුපිටිය, මීගමුව ... | ගම්සභාව සතු කඩපිල, මහහුනුපිටිය | ඌරු මස් පමණක් විකිණීම |
| 14. | නෛයිනා මොහම්මදු නූර් මොහම්මදු, 73/6, මොස්ක් ලේන්, පෙරියමුල්ල, මීගමුව | ගම්සභාව සතු කඩපිල, දළුපොත... | හරක් මස්, එළු මස් සහ ඌරු මස් විකිණීම |
| 15. | කේ. ඇස්. නෛයිනා මොහම්මදු, 73/6, මොස්ක් ලේන්, පෙරියමුල්ල, මීගමුව | ගම්සභාව සතු කඩපිල, කටුවපිටිය | හරක් මස්, එළු මස් සහ ඌරු මස් විකිණීම |
| 16. | ඒ. ආර්. ඇම්. සුලයිමන්, ෂැබීඩියාවත්ත, දෙමන්හන්දිය ... | ගම්සභාව සතු කඩපිල, දෙමන්හන්දිය | හරක් මස්, එළු මස් සහ ඌරු මස් විකිණීම |
| 17. | ඒ. එච්ජින් ප්‍රනාන්දු, මුරුතැන, කොච්චිකඩේ ... | ගම්සභාව සතු කඩපිල, මුරුතැන | හරක් මස්, එළු මස් සහ ඌරු මස් විකිණීම |

01–593—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

## වැල්ලව ගම්සභා ප්‍රදේශය—කුරුණෑගල දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (272 අධිකාරය) 17 ඡේදය යටතේ නියෝගය

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (272 අධිකාරය) 17(1) ඡේදය යටතේ නිසි බලධාරියා වූ වැල්ලව ගම්සභාවේ සභාපති තැන්පත් කේ. පී. ජයසේන වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 1973 වර්ෂය තුල මෙම ගම්සභා ප්‍රදේශය තුල මස් පිණිස සතුන් මැරීම හා මස් වෙළඳාම පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන දිනවලදී මෙයින් සම්පූර්ණයෙන් ම තහනම් කරමි.

### උපලේඛනය

1973 ජනවාරි 18 පසලොස්වක දින.

1973 පෙබරවාරි 4 නිදහස් සමරු දින, 16 වෙනි පසලොස්වක දින.

1973 මාර්තු 18 පසලොස්වක දින.

1973 අප්‍රේල් 17 පසලොස්වක දින.

1973 මැයි 16 සහ 17 වෙසක් උත්සව දින.

1973 ජූනි 15 පසලොස්වක දින.

1973 ජූලි 14 පසලොස්වක දින.

1973 අගෝස්තු 13 පසලොස්වක දින.

1973 සැප්තැම්බර් 12 පසලොස්වක දින සහ 26 වෙනි බණ්ඩාරනායක දින.

1973 ඔක්තෝබර් 4 ලෝක සත්ව දිනය සහ 11 පසලොස්වක දින.

1973 නොවැම්බර් 10 පසලොස්වක දින.

1973 දෙසැම්බර් 9 පසලොස්වක දින.

මෙම දිනයන් වෙනස් වීමට ඉඩ ඇත.

කේ. පී. ජයසේන,
වැල්ලව ගම්සභාවේ සභාපති.

1973. 1. දින,
වැල්ලව ගම්සභා කාර්යාලය,
මරළුවාව,
කුරුණෑගල.

01–808—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

### නුවරඑළිය දිස්ත්‍රික්කයේ කඳපොල ගම්සභාව

#### ගෝ ඝාතක ආඥාපනත

මෙහි පහත සඳහන් යෝජනාව කඳපොල ගම් සභා කාර්යාලයේ දී 1972 ඔක්තෝබර් මස 28 වැනි දින පැවැති කඳපොල ගම් සභාවේ මාසික සභා රැස්වීමේ දී සභා සම්මත වී ඇත. මෙම යෝජනාවට කඳපොල ගම් සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතුන් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

**1972. 10. 28 දින අංක 7 දරණ යෝජනාව :—**

කඳපොල ගම් සභා ප්‍රදේශය තුළ 1973 වර්ෂයේ දී මස් පිණිස සතුන් මැරීම සහ මස් විකිණීම තහනම් කළ යුතු යයි ඇම්. ජී. විල්මන් ප්‍රනාන්දු මහතා විසින් යෝජනා කරන ලදුව ඇම්. ඩී. ජෝතිපාල මහතාගේ ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

ජේ. ඇම්. චාර්ලිස් අප්පු,
කඳපොල ගම් සභාවේ සභාපති.

1973. 01. 06 දින,
කඳපොල.

01–782—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

### කොළඹ දිස්ත්‍රික්කයේ බටුවත්ත ගම්සභාව

#### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් මස් විකිණීම පිණිස 1973 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත්කිරීමට විරුද්ධවන කොළඹ දිස්ත්‍රික්කයේ බටුවත්ත ගම්සභා ප්‍රදේශයේ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධවන්නේ අසවල් කරුණු සඳහායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් 2ක් සිටිනසේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වන පරිච්ඡේදයේ අංක 7 දරණ 1948 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධනයවූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය
ඇම්. ඇස්. පෙරේරා මහතා,
ජයසූරිය පාර,
නෑදුරුපිටිය,
කඳාන.

ස්ථානය හා වෙළඳාම

දකුණු බටගම මස්කඩයේ එළුහරක් මස් විකිණීම හා පවත්වාගෙන යාම

පී. ඊ. වීරරත්න,
බටුවත්ත ගම්සභාවේ සභාපති.

1973. 1. 10 වැනි දින දීය,
ගම්සභා කාර්යාලය, බටුවත්ත.

01–780—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

### රම්බඩගල්ල ගම්සභාව

#### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 අධිකාරයේ 17 (1) දරණ උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලය ප්‍රකාර නියමිත අධිකාරී කේ. ඒ. කරුණාරත්න වන මම, 1973 වර්ෂයේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් දිනවලදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ රම්බඩගල්ල ගම්සභා සීමාව තුළදී මස් පිණිස සතුන් මැරීම, මස් වෙළඳාම පිණිස ප්‍රදර්ශනය කර තැබීම සහ මස් වෙළඳාම සම්පූර්ණයෙන්ම තහනම් බව මෙයින් ප්‍රකාශ කරමි.

#### උපලේඛනය

ජනවාරි 4, 12, 18, 26.
පෙබරවාරි 3, 10, 17, 25.
මාර්තු 4, 12, 18, 26.
අප්‍රේල් 3, 10, 17, 26.
මැයි, 2, 9, 16, 25.
ජූනි 1, 8, 15, 24, 30.
ජූලි 7, 15, 23, 29.
අගෝස්තු 6, 13, 21, 28.
සැප්තැම්බර් 4, 12, 19, 26.
ඔක්තෝබර් 4, 11, 19, 25.
නොවැම්බර් 3, 10, 17, 24.
දෙසැම්බර් 3, 9, 17, 24.

කේ. ඒ. කරුණාරත්න,
පාලන නිලධාරි, රම්බඩගල්ල ගම්සභාව.

1973 ජනවාරි මස 12 වැනි දින,
රම්බඩගල්ල ගම්සභා කාර්යාලයේ දීය.

01–1030—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

#### මුංවත්තබාගේ පත්තු බටහිර ගම් ප්‍රදේශයේ ගම්සභාව

කළුතර දිස්ත්‍රික්කයේ මුංවත්තබාගේ පත්තු බටහිර ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් පහත සඳහන් යෝජනාව සම්මත කරගත් බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙමි.

පී. ආරියසේන පෙරේරා,
සභාපති තැන.

1973 ජනවාරි මස 10 වැනි දින,
හල්කොට–යාලගල,
ගම්සභා කාර්යාලයේ දීය.

#### යෝජනාව

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා පොදු අතුරු ව්‍යවස්ථා ආඥාපනතේ 3 වන වගන්තියේ 1 වෙනි උප වගන්තිය යටතේ මුංවත්තබාගේ පත්තු ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් 1958 අප්‍රේල් මස 18 වෙනි දින අංක 11,300 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද යෝජනාවෙන් සම්මත කර ගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 4 වැනි කාණ්ඩයේ 1 වැනි අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර 1961 සැප්තැම්බර් මස 1 වෙනි දින අංක 12,627 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දු වූද, පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිතුමා විසින් 1962 පෙබරවාරි මස 16 වෙනි දින අංක 12,934 දරණ ගැසට් පත්‍රයේ පළකර තිබෙන නියෝගය පරිදි, දැනට මුංවත්තබාගේ පත්තු බටහිර ගම් ප්‍රදේශයට අදාල වන්නාවූ ද අංක 1 සිට 4, 10 සිට 12, 32 සිට 58 සහ 60 සිට 61 දක්වා ඇති මංමාවත් වලට හා 1964 ජනවාරි මස 10 වෙනි දින අංක 13,913 දරණ ගැසට් පත්‍රයේ පළකර ඇති අංක 1 සිට 7 දක්වා ඇති මංමාවත් වලට හා 1966 සැප්තැම්බර් මස 2 වෙනි දින අංක 14,711 දරණ ගැසට් පත්‍රයේ පළකර ඇති අංක 1 සිට 11 දක්වා ඇති මංමාවත්වලට හා 1968 අගෝස්තු 23 වෙනි දින අංක 14,816 දරණ ගැසට් පත්‍රයේ පළකර ඇති අංක 1 සිට 8 දක්වා ඇති මංමාවත් වලට ද අතිරේක වශයෙන් මෙහි පහත සඳහන් මංමාවත් එකිනෙක ඉදිරියෙන් සඳහන් දිග පළල අනුව සාද හෝ නැවත සාද පවත්වාගෙන යනු ලබන බව මෙයින් යෝජනා කරනු ලැබේ.

| අංකය | පාරේ නම | දිග සැ. | දම්. | පළල අඩි |
|---|---|---|---|---|
| 1 | තලාව–ලෙනවර පාර | 0 | 35 | 14 |
| 2 | කජුගස් වත්ත–ලගාන පාර | 0 | 24 | 14 |
| 3 | ගුංගමුව පුවක්ගහවල කුඹුර–රයිගම පාර | 0 | 35 | 14 |
| 4 | අරකාගොඩ පුංචි ඉඹුල පාර | 0 | 67 | 18 |
| 5 | පුංචි ඉඹුල ආඳදෙල පාර | 1 | 10 | 12 |
| 6 | බැල්ලන්තුඩාව – කොකලාවල පාර | 0 | 30 | 14 |
| 7 | පරගස්කොට–ඉඹුල පාර | 1 | 15 | 14 |

01–819—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

ගම්සභා ආඥාපනත—198 වැනි පරිච්ඡේදය

අටකලන් කෝරලේ ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව

රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් කෝරලේ දෙපත්තු ගම්සභා ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් පහත සඳහන් යෝජනාව සම්මත කර ගත් බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇස්. ඊ. හේරත්හාමි,
සභාපති.

අටකලන් කෝරලේ දෙපත්තු ගම්සභා කාර්යාලය,
පල්ලෙබැද්ද,
73.01.08 වෙනි දින.

යෝජනාව

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා ආඥා පනතේ 3 වැනි වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ අටකලන් කෝරලේ දෙපත්තු ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් වර්ෂ 1954 ක්වූ මාර්තු මස 26 වෙනි දින අංක 10,657 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරණ ලද යෝජනාවෙන් සම්මත කරගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා 4 වැනි කාණ්ඩයේ 1 වැනි අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර මෙහි පහත සඳහන් මංමාවත් එකිනෙක ඉදිරියෙන් සඳහන් දිග හා පළල අනුව සාද හෝ නැවත සාද පවත්වාගෙන යනු ලබන බව මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

| පාරේ අංකය | | පාරේ නම | | දිග දම්වැල් | | පළල අඩි |
|---|---|---|---|---|---|---|
| 51 | ... | පල්ලෙබැද්ද පන්සල පාර | ... | 12 | ... | 16 |
| 52 | ... | කොළඹගෙ ආර පොළ අසළින් යන ආඳලුව පාර ... | ... | 13 | ... | 20 |
| 53 | ... | කරමැටිය කුකුල් අඩිය පාර | ... | 120 | ... | 18 |
| 54 | ... | උල්පත සිට මහකපුයායලයිට පාර දක්වා පාර | ... | 80 | ... | 12 |
| 55 | ... | තලගස් කන්දමහඹමාර පාර | ... | 160 | ... | 18 |
| 56 | ... | මහඹමාර පහලගස් මැද්ද පාර | ... | 120 | ... | 18 |
| 57 | ... | මගෙයාය සිට ගොඩකවෙල තැන්න පාර ... | ... | 80 | ... | 18 |

1–820—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

(261 වැනි අධිකාරය වන) පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි හා 4 වැනි වගන්ති යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් පිළියෙල කරන ලදුව, එම පනතේ 2 වැනි වගන්තියේ ප්‍රකාර අංක 15,001 දරණ 1972 මාර්තු 10 දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වන කොටසේ ප්‍රකාශයට පත් කරන ලද, ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරන ලද බව 1972 ඔක්තෝබර් මස 27 දින අංක 31 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ IV වන කොටසේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූ මෙහි පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව පිළිගැනීමටත්, එය ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වන දින සිට පමුණුගම ගම්සභා ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමටත්, 1973 ජනවාරි මස (09) නම වැනි දින, අංක 1 දරණ තීරණය පරිදි පමුණුගම ගම්සභාවේ පරිපාලන නිලධාරි වන කෝනාර මුදියන්සේලාගේ අබේසිංහ වන මම මෙයින් තීරණය කරමි.

කේ. එම්. අබේසිංහ,
පරිපාලන නිලධාරි,
පමුණුගම ගම්සභාව.

1973 ජනවාරි මස 09 වැනි දින,
පමුණුගම ගම්සභා කාර්යාලයේ දී ය.

අතුරු ව්‍යවස්ථාව

කලින් කල සංශෝධනය කරන ලද පරිදිවූ 1953 අප්‍රේල් 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථා වල XVIII වැනි කොටසෙහි අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදාළ අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි I වැනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අලුත් අතුරු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

"1. මෙම අතුරු ව්‍යවස්ථාවල 'අන්තරාදායක හෝ අප්‍රසන්න ව්‍යාපාර' යන්නෙන් මෙහිවූ උපලේඛනයෙහි අවස්ථාවෝචිත පරිදි I වැනි කොටසේ, II වැනි කොටසේ හෝ III වැනි කොටසේ නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක් අදහස් වේ", තවද

(2) එම කොටසෙහි අවසානයට පහත දැක්වෙන උපලේඛනය අන්තර්ගත කිරීමෙන් ;

උපලේඛනය

I වැනි කොටස

අන්තරාදායක ව්‍යාපාර

කබුක් ,බොරළු හෝ කළුගල් කැණීම.
කබුක්, බොරළු හෝ කළුගල් ගබඩා කිරීම.
සිසිල් බීම නිෂ්පාදනය.
ග්‍රෝස් 1 ට වැඩි ප්‍රමාණයක සිසිල් බීම බෝතල් ගබඩා කර තබා ගැනීම.
අයිස් නිපදවීම.
කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් එළවළු තෙල් නිස්කර්ෂණය.
ගැලුම් 50 ට වැඩි ප්‍රමාණයක පොල් තෙල් ගබඩා කර තබාගැනීම.
පොල් තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක ගැලුම් 12 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබාගැනීම.
ගිනිපෙට්ටි නිෂ්පාදනය.
ග්‍රෝස් 10 කට වැඩි ප්‍රමාණයක ගිනිපෙට්ටි ගබඩා කර තබාගැනීම.
ඉබුල් පුලුන් හෝ කපු හෝ කපු පුලුන් ගබඩා කර තබාගැනීම.
මැතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබාගැනීම.
ගඩොල් හෝ උළු ගබඩාකර තබාගැනීම.
තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබාගැනීම.
කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදන කිරීම හෝ ගබඩා කර තබාගැනීම.
පිදුරු ගබඩා කර තබාගැනීම.
පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තබාගැනීම.
කුලියට දීම සඳහා ලාම්පු ගබඩා කර තබාගැනීම.
ධාන්‍ය හෝ මංඡ භෝග හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබාගැනීම.
ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත් වැඩියා කිරීම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන කම්මලක් පවත්වාගෙන යෑම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යෑම.
අතින් ලී ඉරණ ඉරුම් වලක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යෑම.
දැව ගබඩාවක් පවත්වාගෙන යෑම.
දර ගබඩාවක් පවත්වාගෙන යෑම.
තිරිගල් හෝ හුණුගල් සඳහා හෑරීම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකෙරෙන කම්මලක් පවත්වාගෙන යෑම.
තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි හොණ්ඩර 15 ට වැඩි කිසියම් ප්‍රමාණයක් ගබඩා කර තබාගැනීම.
හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩා කර තබාගැනීම.
බයිසිකල් හෝ මෝටර් සයිකල් අලුත්වැඩියා කිරීම සඳහා වැඩ පලක් පවත්වාගෙන යෑම.
අලුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබාගැනීම.
පොල් කටු ගබඩා කර තබාගැනීම.
ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු හොණ්ඩර 1 වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබාගැනීම.
පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්‍ර කඩදාසි හෝ ගබඩා කර තබා ගැනීම.
විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටිං) සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.
අත්යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ විවීම.
අත්යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් රෙදි නිපදවීම.
සිල්ක් සහ කෘත්‍රිම රෙදි වියීම හා විසිතුරු කිරීම.
මැසූ ඇඳුම් නිෂ්පාදනය.
මුද්‍රණාලයක් පවත්වාගෙන යෑම.

II වැනි කොටස

අප්‍රසන්න ව්‍යාපාර

මිතිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
පෝර හෝ රසායන පෝර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.
හම් ගබඩාකර තබා ගැනීම.
උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ හොණ්ඩර 5 කට වැඩි ප්‍රමාණයක් උම්බලකඩ ගබඩාකර තබා ගැනීම.
කුකුලන් 100 ට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යෑම.
බැටළුවන්, එළුවන් හෝ ඌරන් දහයකට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යෑම.

රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.
පශු වෛද්‍ය ශිල්පී හලක් පවත්වාගෙන යෑම.
පුවක් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.
කරවල, ලුනු මාළු හෝ ජාඩි හොණ්ඩර 3 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම, හෝ අයිස් දැමීම.
අඟුරු සඳහා දැව හෝ පොල්කටු දැවීම හෝ අඟුරු ගබඩා කර තබා ගැනීම.
සිමෙන්ති හොන්ඩර 25 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.

දුම්කොල සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
සත්වාහාර ගබඩාවක් පවත්වාගෙන යාම.
පුන්නක්කු ටොන් 1ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
සත්වාහාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය කිරීම.
සතුන්ගේ මාංශාවශේෂ හෝ ලේ පැසවීම.

සබන් නිෂ්පාදනය කිරීම.
සව් හෝ මංඤොක්කා කැපි (ටැපියෝකා) නිපදවීම.
ඇටකටු ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් හෝ පවත්වාගෙන යෑම.
ට්‍රන්ක් පෙට්ටි සෑදීම.

අළුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම.
ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.
ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
මෙරට හෝ රට වේවැලින් භාණ්ඩ සෑදීම හෝ එයින් කළ භාණ්ඩ ගබඩා කර තබා ගැනීම.

වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කර තබා ගැනීම.
සිරප් හෝ පළතුරු බීම වර්ග සෑදීම.

රස කැවිලි වර්ග නිපදවීම.
පොල්ලෙලි හෝ දැව පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යාම.

මේද නිපදවීම හෝ නිශ්කර්ෂණය කිරීම.
දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිපදවීම.
දත් බුරුසු නිපදවීම.
රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
විනාකිරි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

ඇසිඩ් වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
හුණු ගල් හෝ හුණු ගබඩා කර තබා ගැනීම.
පැණි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
ලැලි සකස් කිරීම හෝ ලැලි පදම් කිරීම.
කෝඩා නිපදවීම.
කෙඳි සායම් කිරීම.
කොකෝවා හෝ වියළි පැපොල් කිරි ගබඩා කර තබා ගැනීම.
සම් භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම.
පළතුරු මාළු හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇසිරීම.
කෝපි, ධාන්‍ය වර්ග, මාංශ බෝග කුළු බඩු හෝ පිටි ඇඹරීම.
යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාංශ බෝග කෙටීම.

බේකිං පව්ඩර් නිපදවීම.
මාජරීන් නිපදවීම.
ගෑස් මැන්ටල් නිපදවීම.
පොට් නිපදවීම.
ඉටිපන්දම් නිපදවීම.
කපුරු නිපදවීම.

ලියන තීන්ත හෝ අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.
රෙදි සෝදන නිල් නිපදවීම.
සායම් කුඩු නිපදවීම.
ලාකඩ නිපදවීම.
සුවඳ පුයර නිපදවීම.

පාසල් රටහුණු නිපදවීම.
ටයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
ටයර් හෝ ටියුබ් වල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බෙස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.

වැලි කඩදාසි නිපදවීම.
ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔපදැමීම.
පාසල් ගල්ලැලි නිපදවීම.
ඖෂධ්‍ය තුවාලකුඩු නිපදවීම.

ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.
සෙල්ලම් බඩු නිපදවීම.
මුහුදු පාසි සකස් කිරීම හා ගබඩා කර තැබීම.
ශීත කළ මස් හෝ මාළු ගබඩාකර තැබීම.
කපාපු පොල් නිපදවීම.

ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යෑම.
මැණික් ගල් කැපීම හා ඔප දැමීම.
දියහුණු සුදු (වයිට්ං) හුණු හෝ හිරියල් නිපදවීම.
එන්සාල් (කරදමුංගු) සකස් කිරීම හෝ වේලීම.

## III කොටස

### අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

තලාතු මිනිරන් ශුද්ධ කිරීම.
රසායන ද්‍රව්‍ය පාවිච්චි කොට කුරුඳු (කරදමුංගු) එන්සාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම.

ඩ්‍රයික්ලීන් කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යාම.
රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ආයතනයක් පවත්වාගෙන යාම.
විද්‍යුත් ලෝහයලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම.

තෙල් හෝ සත්ත්ව මේද පැසවීම.
හුණු පිළිස්සීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණු ගල් කැඩීම.
මැටි බඳුන් ඔප දැමීම.
ගිණි කෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
මෝර වරල් සකස් කිරීම හෝ ගබඩා කර තැබීම.
හොණ්ඩර 3 ට වැඩියෙන් තේ ගබඩා කර තබා ගැනීම.
බැට්රි චාර්ජ් කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
වැල්ඩිං සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.

මෝටර් වාහන සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යාම.
බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.

යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම.
වාත්තු මඩුවක් පවත්වාගෙන යාම.
බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම.
ගල් ස්මාරක නිපදවීම.
පැට්රල්, ඩීසල් තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම.
පැට්රල් නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.

මෝටර් වාහන සඳහා බොඩි නිපදවීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
පොලිෂ් හෝ ඉටි වර්ග නිපදවීම.
කෘෂිරසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩාකර තබාගැනීම.
විෂබීජ නාශක ද්‍රව්‍ය නිපදවීම.
මදුරු කවා (කොයිල්) නිපදවීම.

ලී දඬු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම.
රබර් ද්‍රාවක හෝ රබර් සිමෙන්ති නිපදවීම.
ගල්තාර හෝ වෙනත් බිටුමන්මය නිෂ්පාදන නිපදවීම.
වීදුරු භාණ්ඩ නිපදවීම.
වීදුරු කැඩපත් නිපදවීම.
යකඩ තහඩු ගැල්වනයිස් කිරීම.
පාස්සන ඊයම් නිපදවීම.
ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම.
කටුකම්බි නිපදවීම.

කම්බි ඇණ නිපදවීම.
කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම.
බෙලෙක් බඳුන්, වාතේ පීප්ප හෝ ගබඩා ටැන්කි නිපදවීම.
ජී. අයි. බාල්දි නිපදවීම.
වායු සමන යන්ත්‍ර, ශීතකරණ, අධිශීතකරණ (ඩීප්ප්‍රීසර්) නිපදවීම.
සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
බ්‍රෙක් ලයිනිං හෝ ක්ලච් ලයිනිං නිපදවීම.
යන්ත්‍රෝපකරණ නිපදවීම.
විදුලිභාණ්ඩ නිපදවීම.
රබර් කැවුණු කෙඳි වර්ග නිපදවීම.

සංචායක බැට්රි නිපදවීම.
වියළි කෝෂ බැට්රි නිපදවීම.
ඊයම් බැට්රි නැවත චාර්ජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.

රන්කම් සුන් බුන් වලින් වටිනා ලෝහ නිශ්කර්ෂණය සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.

ට්‍රැක්ටර් රථ එකලස් කිරීම.
රේඩියෝටර් නිපදවීම.
විදුලි කර්මාන්ත වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කරන වැඩපලක් හෝ ගුවන් විදුලියන්ත්‍ර නිපදවන වැඩපලක් පවත්වාගෙන යාම.

1-778—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| ජනවාරි | 73.01.05 සිකුරාද | 72.12.29 සිකුරාද | දවල් 12.00 |
| | 73.01.12 සිකුරාද | 73.01.05 සිකුරාද | දවල් 12.00 |
| | 73.01.19 සිකුරාද | 73.01.12 සිකුරාද | දවල් 12.00 |
| | 73.01.26 සිකුරාද | 73.01.19 සිකුරාද | දවල් 12.00 |
| පෙබරවාරි | 73.02.02 සිකුරාද | 73.01.26 සිකුරාද | දවල් 12.00 |
| | 73.02.09 සිකුරාද | 73.02.02 සිකුරාද | දවල් 12.00 |
| | 7302.15 බ්‍රහස්පතින්ද | 73.02.09 සිකුරාද | දවල් 12.00 |
| | 73.02.23 සිකුරාද | 73.02.15 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| මාර්තු | 73.03.02 සිකුරාද | 73.02.23 සිකුරාද | දවල් 12.00 |
| | 73.03.09 සිකුරාද | 73.03.02 සිකුරාද | දවල් 12.00 |
| | 73.03.16 සිකුරාද | 73.03.09 සිකුරාද | දවල් 12.00 |
| | 73.03.23 සිකුරාද | 73.03.16 සිකුරාද | දවල් 12.00 |
| | 73.03.30 සිකුරාද | 73.03.23 සිකුරාද | දවල් 12.00 |
| අප්‍රේල් | 73.04.06 සිකුරාද | 73.03.30 සිකුරාද | දවල් 12.00 |
| | 73.04.11 බදාද | 73.04.06 සිකුරාද | දවල් 12.00 |
| | 73.04.19 බ්‍රහස්පතින්ද | 73.04.11 බදාද | දවල් 12.00 |
| | 73.04.27 සිකුරාද | 73.04.19 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.